<u>කීටාගිරි සූත්‍රය (පළමුවෙනි කොටස)</u>
<u>08.09.2018 - ශ්‍රී ලංකාරාමය</u>
<u>නවසීලන්තය</u>

ශ්‍රද්ධාවන්ත පින්වත්නි, අද අපි ලොව්තුරා බුදුරජාණන්වහන්සේ දේශනාකොට වදාළ විශේෂ සූත්‍ර දේශනාවක් ඉගෙන ගනිමු, දැන ගනිමු. බුදුරජාණන්වහන්සේගේ දේශනා හඬ නැති උනත් උන්වහන්සේගේ දේශනා සාරය ඒ උතුම් මහ රහතන්වහන්සේලා සජ්ඣායනා කරලා ආරක්ෂා කරලා අපිට දීලා තිබෙනවා. ඒ මහ රහතන්වහන්සේලා දේශනා කරලා තිබෙන ආරක්ෂා කරලා තිබෙන අපිට ඉතුරු කරලා තිබෙන සූත්‍ර දේශනාවක් අපි අද සාකච්ඡා කරනවා, මේ පින්වතුන්ට කියලා දෙනවා. මේ සූත්‍ර දේශනාවේ නම 'කීටාගිරි සූත්‍රය'. අපි නමස්කාරය කියලා සූත්‍රය සාකච්ඡා කරමු.

<u>නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස</u>
<u>නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස</u>
<u>නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස</u>

අපි අද මේ කියලා දෙන සූත්‍ර දේශනාවෙන් විශේෂ ධර්ම කරුණු ටිකක් මතුකරලා දෙනවා. ඒ දහම් කරුණු ටික මේ පින්වතුන්ට ඉතාමත් හොඳින් තේරුම් ගන්න ලැබේවා! හොඳින් වටහා ගන්න ලැබේවා! ඒවාගේම මේ සූත්‍ර දේශනාවේ කියවෙන දහම් කරුණු හොඳට තේරුම් අරගෙන වටහාගෙන අවබෝධ කරගෙන ඒ තුලින් ප්‍රතිපදාව දියුණු කරගෙන පරියත්ති සාසනයේ යෙදිලා, ප්‍රතිපත්ති සාසනයේ යෙදිලා අවසානයේදී ප්‍රතිවේධ සාසන යයි කියන්නා වූ චතුරාර්ය සත්‍යය ධර්මයන් අවබෝධ කරගෙන නිවන් සාක්ෂාත් කරගන්න ලැබේවා! කියලා මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා.

මේ සූත්‍ර දේශනාවේ මේ විදියට කියවෙනවා. පළමු කොටම අපි මේ පින්වතුන්ට මතක් කරන්න ඕනෑ, ලෝකයේ භාවිතාවෙන විවිධ භාෂාවල් කීපයක්ම තිබෙනවා. මේ රටේ ප්‍රධාන වශයෙන් කථා කරන්නේ ඉංග්‍රීසි භාෂාව. තව තිබෙනවා ප්‍රංශ භාෂාව, ජර්මන් භාෂාව. ඒවා බටහිර ගණයට අයිති වෙන භාෂාවල්. තව රුසියන් භාෂාව තිබෙනවා, ඉතාලි භාෂාව කියලා එකක් තිබෙනවා. පරණ භාෂාවල් හැටියට තිබෙනවා රෝමයේ කථා කරපු ලතින් භාෂාව. ඒවාගේම තව තිබෙනවා සංස්කෘත භාෂාව, පාලි භාෂාව සහ සිංහල භාෂාව. මේවා එකිනෙකට වෙනස්. ඒ ජන සමාජ ඒ ඒ පළාත් වල සම්මත කරගෙන හුරු කරගෙන පාවිච්චි කරපු ඒ ගොල්ලන්ගේ අදහස් උදහස් අනිත් එක්කෙනාට ප්‍රකාශ කිරීම සඳහා යොදා ගත්ත වචන වැල්, පද, වාක්‍යය තමයි භාෂාව කියලා කියන්නේ. අද අපි මේ කථා කරන සූත්‍රය සාකච්ඡා කිරීමේදී අපිට භාෂාවල් දෙකක් හමුවෙනවා. ඒ තමයි පාලි භාෂාව සහ සිංහල භාෂාව.

බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කරලා තිබෙන්නේ පාලි භාෂාවෙන්. ඒකට ඉස්සර කියලා තිබෙනවා මාගධී භාෂාව කියලා. මගධ රාජ්‍යයේ කථා කරපු මාගධී භාෂාවෙන් තමයි මේ ධර්ම දේශනාව කරලා තිබෙන්නේ. ඊළඟට ඒක සජ්ඣායනා කරලා තිබෙන්නෙත් පාලි භාෂාව හෙවත් මාගධී භාෂාවෙන්. මාගධී භාෂාවෙන් තිබෙන්නා වූ ඒ දහම් අර්ථය සිංහලට පරිවර්තනය කරනවා අපිට තේරුම් ගන්න පුළුවන් වෙන විදියට.

<u>කීටාගිරිසුත්තං</u>

එවං මෙ සුතං – එකං සමයං භගවා කාසීසු චාරිකං චරති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි – ''අහං ඛො, භික්ඛවෙ, අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජාමි. අඤ්ඤත්‍ර ඛො පනාහං, භික්ඛවෙ, රත්තිභොජනා භුඤ්ජමානො අප්පාබාධතඤ්ච සඤ්ජානාමි අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච

බලඤ්ච ඵාසුවිහාරඤ්ච. එථ, තුම්හෙපි, භික්ඛවෙ, අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජථ. අඤ්ඤත්‍ර ඛො පන, භික්ඛවෙ, තුම්හෙපි රත්තිභොජනා භුඤ්ජමානා අප්පාබාධතඤ්ච සඤ්ජානිස්සථ අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්චා''ති. ''එවං, භන්තෙ''ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. අථ ඛො භගවා කාසීසු අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන කීටාගිරි නාම කාසීනං නිගමො තදවසරි. තත්‍ර සුදං භගවා කීටාගිරිස්මිං විහරති කාසීනං නිගමෙ.

එවං මෙ සුතං – එකං සමයං භගවා කාසීසු චාරිකං චරති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං - 'එවං මෙ සුතං' කියන කාණ්ඩය කාගේ වචනයක්ද? බුදුරජාණන් වහන්සේ දේශනා කළ එකක්ද? නෑ, ආනන්ද ස්වාමීන්වහන්සේ පළවෙනි ධර්ම සජ්ඣායනාවේදී සංඝයා අමතා සූත්‍රය ඉදිරිපත් කරන්න පාවිච්චි කරපු යතුරු වචනය. ඒ කියන්නේ key phrase එක.

එවං මෙ සුතං = මා විසින් මෙසේ අසන ලදී. බලන්න ආර්යන් වහන්සේලාගේ හොඳ ප්‍රකාශන. 'මම මේ විදියට කියනවා' – 'මට මේ විදියට ඉගැන්නුවා' කියන කථාවල් කියන්නේ නෑ. ඒ වෙනුවට කියන්නේ 'මා විසින් මෙසේ අසන ලදී' කියලා. ඒක තමයි නිවැරදි ක්‍රමය, අහලා තිබෙන විදියටයි කියන්නේ.

එකං සමයං භගවා කාසීසු චාරිකං චරති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං.	එක් සමයක භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ කාසී ජනපදයේ චාරිකාවක යෙදෙනවා, මහා විශාල භික්ෂු සංඝයා පිරිසක් සමගින්.
තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි -	භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා ආමන්ත්‍රණය කරනවා

භික්ෂු සංඝයා ආමන්ත්‍රණය කරලා භාග්‍යවතුන් වහන්සේ මෙහෙම කථාවක් කියනවා

''අහං ඛො, භික්ඛවෙ, අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජාමි.	"මහණෙනි රාත්‍රී භෝජනය අතහැරලා තමයි මම ආහාර වළඳන්නේ, රාත්‍රියට ආහාර ගන්නේ නෑ". **'අඤ්ඤත්‍රෙව'** කියලා කියන්නේ 'without = හැර = වැළකිලා' කියන එකයි.
අඤ්ඤත්‍ර ඛො පනාහං, භික්ඛවෙ, රත්තිභොජනා භුඤ්ජමානො	"මහණෙනි, මම රාත්‍රී කාලයේ ඒ භෝජනය අත්හැරලා දාලා රාත්‍රී භෝජනයෙන් වැළකිලා කටයුතු කරනකොට,
අප්පාබාධතඤ්ච **අප්පාතඞ්කතඤ්ච** **ලහුට්ඨානඤ්ච** **බලඤ්ච** **ඵාසුවිහාරඤ්ච.**	මට ලෙඩත් අඩුයි කයට ඇතිවෙන්නා වූ අපහසුතාවයත් අඩුයි සැහැල්ලු පැවතුමත් ශාරීරික බලයත් පහසුවෙන් වැඩ ඉන්න පුළුවන් ගතියත් තිබෙනවා" කියලා භාග්‍යවතුන්වහන්සේ ප්‍රකාශ කරනවා.

දැන් බලන්න, මෙහි ආනිසංස පහක් තිබෙනවා. අල්ප අබාධ සහිත වෙනවා. තමන්ගේ ශරීරයට ඇතිවෙන පීඩාවල් අඩුවෙනවා. සැහැල්ලු පැවතුමද ශාරීරක බලයද පහසු විහරණයද ඇතිවෙනවා.

ඊළඟට බුදුරජාණන්වහන්සේ මෙසේ දේශනා කරනවා

එථ, තුම්හෙපි, භික්ඛවෙ, අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජථ. අඤ්ඤත්‍ර ඛො පන, භික්ඛවෙ, තුම්හෙපි රත්තිභොජනා භුඤ්ජමානා අප්පාබාධතඤ්ච සඤ්ජානිස්සථ අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්චා’’ති.	මහණෙනි, ඔබ සියලු දෙනාමත් රාත්‍රී ආහාරය කපා හරින්න. රාත්‍රියේ දී අහාර වළඳන්නේ නැතුව කටයුතු කරනකොට ඔබලාටත් ආබාධ ආදිය අඩුවෙනවා. ශාරීරික අපහසුතාවයන්ද අඩුවෙනවා. සැහැල්ලු පැවතුමත් ශාරීරික බලයත් පහසු විහරණයත් ඇතිවෙනවා.

දැන් මේ කථාව කිව්වේ කාටද? බුදුරජාණන්වහන්සේ භික්ෂූන් වහන්සේලාටයි මේ කියන්නේ, ගිහියන්ට නොවෙයි. මේ දේශනාව බුදුරජාණන්වහන්සේ හිතලා කරපු එකක් නොවෙයි. බුදුරජාණන්වහන්සේ අත් දැකලා ඒ අත්දැකීමයි මේ භික්ෂූන් වහන්සේලාට දේශනා කරන්නේ.

‘‘එවං, භන්තෙ’’ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං.	‘එහෙමයි ස්වාමීනි’ කියල ඒ භික්ෂූන් වහන්සේලා පිළිතුර දෙනවා.

අථ ඛො භගවා කාසීසු අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන කීටාගිරි නාම කාසීනං නිගමො තදවසරි.	මෙසේ කාසී ජනපදයේ පිළිවෙලින් චාරිකාවේ හැසිරිලා එම කාසි ජනපදයේ තිබෙන කීටාගිරි නම් ගම්මානයට උන්වහන්සේ වැඩම කළා.

තත්‍ර සුදං භගවා කීටාගිරිස්මිං විහරති කාසීනං නිගමෙ.	දැන් බුදුරජාණන්වහන්සේ ඒ කාසී රටේ (කොසොල් රටේ) කීටාගිරි නම් ගම්මානයේ වැඩ ඉන්නවා. (නිගම කියලා කියන්නේ විශාල ජනපදයක්).

තෙන ඛො පන සමයෙන අස්සජිපුනබ්බසුකා නාම භික්ඛූ කීටාගිරිස්මිං ආවාසිකා හොන්ති. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන අස්සජිපුනබ්බසුකා භික්ඛූ තෙනුපසඞ්කමිංසු; උපසඞ්කමිත්වා අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ එතදවොචුං – ‘‘භගවා ඛො, ආවුසො, අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජති භික්ඛුසඞ්ඝො ච. අඤ්ඤත්‍ර ඛො පනාවුසො, රත්තිභොජනා භුඤ්ජමානා අප්පාබාධතඤ්ච සඤ්ජානන්ති අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්ච. එථ, තුම්හෙපි, ආවුසො, අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජථ. අඤ්ඤත්‍ර ඛො පනාවුසො, තුම්හෙපි රත්තිභොජනා භුඤ්ජමානා අප්පාබාධතඤ්ච සඤ්ජානිස්සථ අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්චා’’ති. එවං වුත්තෙ, අස්සජිපුනබ්බසුකා භික්ඛූ තෙ භික්ඛූ එතදවොචුං – ‘‘මයං ඛො, ආවුසො, සායඤ්චෙව භුඤ්ජාම පාතො ච දිවා ච විකාලෙ. තෙ මයං සායඤ්චෙව භුඤ්ජමානා පාතො ච දිවා ච විකාලෙ අප්පාබාධතඤ්ච සඤ්ජානාම අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්ච. තෙ මයං කිං සන්දිට්ඨිකං හිත්වා කාලිකං අනුධාවිස්සාම? සායඤ්චෙව මයං භුඤ්ජිස්සාම පාතො ච දිවා ච විකාලෙ’’ති.

තෙන ඛො පන සමයෙන අස්සජිපුනබ්බසුකා නාම භික්ඛූ කීටාගිරිස්මිං ආවාසිකා හොන්ති.	මේ කාලයෙහි අස්සජි සහ පුන්බ්බසුක කියලා භික්ෂූන් වහන්සේලා දෙදෙනෙක් කීටාගිරියේ වැඩ ඉන්නවා.

අහලා තිබෙනවද මේ අස්සජි සහ පුන්බ්බසුක කියන කට්ටිය ගැන? මේ අය කීටාගිරියේ වැඩ සිටිය හාමුදුරුවරු දෙන්නෙක්. බුදුරජාණන්වහන්සේගේ කාලයේ හිටියා විශේෂ භික්ෂූන්වහන්සේලා 6 දෙනෙක්. ධර්මය හොයන ධර්මය ඉගෙන ගන්න මේ පින්වතුන් මේ ගැන දැන ගන්න ඕන. ඒ අය කල්ලියක්, 6 යේ කණ්ඩායම කියලා කියන්නේ. පාලියෙන් **‘ඡ’** කියන්නේ හය. ඒ හය දෙනාගේ කණ්ඩායමට කියන්නේ **ඡබ්බග්ගිය** භික්ෂූන් වහන්සේලා කියලා. ඒ හය දෙනා අමුතුම විදියේ හය

දෙනෙක්. අමුතුම චරිත. ගොඩාක් ශික්ෂාපද පනවලා තිබෙනවා මේ හය දෙනා නිසා. මේ හය දෙනාගේ නම් මතක තබා ගන්න. පණ්ඩුක, ලෝහිතක, මෙත්තිය, භුම්මජක, අස්සජි, පුනබ්බසුක කියන මේ හය දෙනා අමුතුම චරිත ඇති භික්ෂූන් වහන්සේලා හය දෙනෙක්.

සිද්ධියක් කියන්නම් මේ අය සම්බන්ධයෙන් - එක දවසක් රජගහ නුවර බුදුරජාණන් වහන්සේ වැඩ ඉන්න කාලේ 'ටක' 'ටක' ගාලා ශබ්දයක් ඇහෙනවා, අශ්වයෝ යන ශබ්දයක් වගේ. ඒ වේලාවේ බුදුරජාණන් වහන්සේ ආනන්ද හාමුදුරුවන් කථා කරලා කියනවා "ආනන්ද 'ටක' 'ටක' ගාල සද්දයක් ඇහෙනවා ඒ මොකක්ද?" කියලා. එවිට ආනන්ද හාමුදුරුවෝ බුදුරජාණන්වහන්සේට කියනවා 'අර ඡබ්බග්ගිය හාමුදුරුවරු සක්මන් කරනවා' කියලා. ඒ අය සක්මන් කරන්නේ ලී සෙරෙප්පු දාගෙන (කට්ය සෙරෙප්පු) ලී දෙකකුත් අතින් අරගෙන. ඒ අය ඒවා ඇන ඇන 'ටක' 'ටක' ගාලා ගල් පතුරු උඩ ඇවිදිනවා. ඒක තමයි ඇහුන සද්දේ. බුදුරජාණන්වහන්සේ ඒ වෙලාවේදී කථා කරලා බණක් දේශනා කරනවා, "භික්ෂූන් වහන්සේලා හැටියට කයින් සංවර වෙන්න ඕනෑ, වචනයෙන් සංවර වෙන්න ඕනෑ, මනසින් සංවර වෙන්න ඕනෑ" කියලා. ඒ දේශනා කරපු ගාථාව ධම්මපදයේ තිබෙනවා. මේ ඒ අය කරපු එක වැඩක් ඔය.

මේ ඡබ්බග්ගිය භික්ෂූන් වහන්සේලා කළ තවත් එකක් සඳහන් වෙලා තිබෙනවා විනයේ. ජීවත් වීමේ පහසුව සඳහා මේ අය විවාහ ජීවිත ගත කරපු ඒ අයගේ හාමිනේලාත් එක්කම තමයි මහණ උනේ. හාමිනේලා ගිහිල්ලා භික්ෂුණී ආරාමවල මහණ උනා. හාමිනේලාත් එක්ක මහණ වූ බොහෝ අය හරි කබල් වැඩ කරලා තිබෙනවා. දැනුත් එහෙමයි. ඒ කාලෙත් එහෙමයි. එක දවසක් බුදුරජාණන්වහන්සේ භික්ෂූන්වහන්සේලාට අනිත් අයගේ කිසිම දෙයක් 'හොරෙන් යමක් ගන්න එපා' කියලා හොරකම පිළිබඳව පාරාජිකාවක් පැනෙව්වා. දැන් භික්ෂූන් වහන්සේලා යම් කිසි කෙනෙකුගේ දෙයක් ගන්න හරි හයයි. කවුරුවත් නූල් පොටක දෙයක්වත් ගන්නේ නෑ. බුදුරජාණන් වහන්සේ තවත් තැනකදී දේශනා කරලා තිබෙනවා සොහොනක හෝ පාරක තිබෙන දෙයක් පංසුකූල සංඥාවෙන් ගන්න පුළුවන් කියලා. පංසුකූල කියලා කියන්නේ යම් කිසි රෙදි කඩක්, යම් කිසි භාණ්ඩයක් බිමට වැටිලා ඒක පස්වල බොහෝ කාලයක් තිබිලා දිරාපත් වෙලා පස් වලටම අනුකූල වෙනවා. දිරාපත් වෙලා පස් වලට පරිවර්තනය වෙනවා. 'පාංශු වලට අනුකූල වෙලා' දිරාපත් වෙන දේට කියනවා පංසුකූල කියලා. සොහොනක යම් කිසි දෙයක් දාල තිබුනොත් වැස්සට තෙමිලා ඒක දිරා පත් වෙලා පසට අනුකූල වෙනවා. ඒවගේ කුණු ගොඩවල් වල තිබෙන ඒවාට කියනවා කියනවා පංසුකූල රෙදි කියලා.

දවසක් මේ හාමුදුරුවරු ගමනක් යනවා. එතකොට දැක්කා රෙදි අපුල්ලන මනුස්සයෙක් රෙදි හෝදලා දිගට වනලා තිබෙනවා. ඒතන හොඳ හොඳ රෙදි තිබුනා. මේ හාමුදුරුවරු ගිහිල්ලා 'මේක දිගටම මෙතන තිබුනොත් දිරලා පස් වෙනවා' කියලා පංසුකූල සංඥාවෙන් ඒ ටික ඔක්කෝම අරගෙන කරතියාගෙන ගියා. අයිති කාරයෝ ආව හොයාගෙන. ආන්න ඒ වගේ දේවල් ඒ හාමුදුරුවරු කළා.

මේ අයට කිසිම ලැජ්ජාවක් චාරවත් ගතියක් මුකුත් නෑ. ඒ ඡබ්බග්ගිය භික්ෂූන් වහන්සේලාගේ හැටි. කිසිම ලජ්ජාවක් බයක් නැතුව ඕනෑම දෙයක් කරනවා. ඒ අය තවත් දෙයක් කළා. සමහර වේලාවට ආහාරය පිණිස හම්බවෙන පැණිරහ බත් වර්ග තිබෙනවා. ඒ බත් වලින් මේ අය ලොකු ගුලි හදාගන්නවා. ගුලි හදාගෙන යමින් ගමන් අඹ ගෙඩි කනවා වගේ ඒවා කකා යනවා. බුදුරජාණන්වහන්සේ එහෙම ලොකු ගුලි හදලා වළඳන එක අකැපයි, හොඳ නෑ කියලා තහනම් කළා. ඊට පස්සේ ඒ අය කෙහෙල් ගෙඩිය වගේ දිගට හදලා කකා ගියා. බෝල හදන්න එපා කියලා කියපු නිසා දිගට හැදුවා. ඔය ඡබ්බග්ගිය භික්ෂූන් වහන්සේලා ඕන්න ඔය වගේ වැඩ කරපු කට්ටියක්. මේ වගේ මේ ගොල්ලො කරපු වැඩ විනයේ ගොඩක් තිබෙනවා.

තව හිටියා **සත්තරසවග්ගිය** භික්ෂූන් වහන්සේලා කියලා පොඩි හාමුදුරුවරු 17 දෙනෙක්. ඒ ගොල්ලෝ පුංචි කාලේ ඉඳලාම එකට සෙල්ලම් කරලා එකට හැදිච්ච ළමයි. එක්කෙනක් මහණ වෙනකොට ඒ ළමයි 17 දෙනාම මහණ උනා. හැම වෙලේම මේ 17 දෙනා එකට ඉන්නේ. ඒක නිසා මේ පොඩි හාමුදුරුවරුන්ට කියන්නේ සත්තරසවග්ගිය භික්ෂූන් වහන්සේලා කියලා. හරි අහිංසකයි. ඡබ්බග්ගිය

හාමුදුරුවරු ගිහිල්ලා එක දවසක් සත්තරසවග්ගිය භික්ෂුන්වහන්සේ කෙනෙක් අල්ලාගෙන කිති කවලා හිනස්සවලා හුස්ම ගන්න බැරුව ඒ හාමුදුරුවෝ අපවත්උනා. ඊට පස්සේ ඒ නැදැයෝ ඇවිල්ලා ඒ අයට ගැහුවා. මේ ඡබ්බග්ගිය හාමුදුරුවෝ ඔයවගේ notorious වැඩ කරනවා. හැබැයි මේ හය දෙනා හිටියේ තුන්පොළක. පණ්ඩුක, ලෝහිතක කියන දෙන්නා හිටියේ සැවැත්නුවර. මෙත්තිය, භුම්මජක කියන දෙන්නා හිටියේ රජගහනුවර. අස්සජි, පුනබ්බසුක කියන දෙන්නා හිටියේ කීටාගිරියේ. මේ ගොල්ලා වරින් වර එකතු වෙනවා. එකතු වෙලා මේවගේ එක එක වැඩ කරනවා. තවත් දවසක මේ හාමුදුරුවරු දෙපට සිවුර බිම දාල ඒක උඩ නටනවා. එතැනදීත් බුදුරජාණන්වහන්සේ එහෙම කරන්න එපා කියලා ශික්ෂාපද පැනෙව්වා. තවත් දවසක දානෙකට වැඩලා එන ගමන් ඉඳුල් භාජනයක් පොඩි හාමුදුරුවෝ නමකගේ ඔළුවේ හැලුවා. මේ වගේ ඡබ්බග්ගිය භික්ෂුන්වහන්සේලා අනිත් අයට හිංසා කරන මහා අමුතුම වැඩ කරන කට්ටියක්. ශික්ෂාපද පිළිබඳව ගානක් නෑ ඒ අයට.

දැන් එතකොට මේ කථාව කියවෙන්නේ කොහේද? කීටාගිරියේ. අස්සජි, පුනබ්බසුක දෙන්නා තමයි එහෙ ඉන්නේ.

තෙන ඛො පන සමයෙන අස්සජිපුනබ්බසුකා නාම භික්ඛූ කීටාගිරිස්මිං ආවාසිකා හොන්ති.	මේ කාලයෙහිදී අස්සජි සහ පුන්බ්බසුක කියලා භික්ෂුන් වහන්සේලා දෙදෙනෙක් වැඩ ඉන්නවා කීටාගිරියේ.
අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන අස්සජිපුනබ්බසුකා භික්ඛූ තෙනුපසඞ්කමිංසු;	භික්ෂුන්වහන්සේලා පිරිසක් අස්සජි සහ පුන්බ්බසුක කියන භික්ෂුන්වහන්සේලා ඉන්න තැනට වඩිනවා.
උපසඞ්කමිත්වා අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ එතදවොචුං – ‘‘භගවා ඛො, ආවුසො, අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජති භික්ඛුසඞ්ඝො ච.	ගිහිල්ලා ‘ඇවැත්නි බුදුරජාණන් වහන්සේත් භික්ෂු සංඝයාත් දැන් රාත්‍රී කාලයේ ආහාරපාන ගැනීමෙන් වැළකී සිටින්නේ’ කියා පවසනවා.
අඤ්ඤත්‍ර ඛො පනාවුසො, රත්තිභොජනා භුඤ්ජමානා අප්පාබාධතඤ්ච සඤ්ජානන්ති අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්ච.	රාත්‍රියට ආහාර නොගැනීම නිසා ලෙඩ දුක් අඩුයි. ශාරීරික පැවැත්ම හොඳයි. සැහැල්ලු පැවතුම් ඇතිවෙනවා. ශාරීරක බලය තිබෙනවා, පහසුවෙන් වැඩ ඉන්න පුළුවන්.
එථ, තුම්හෙපි, ආවුසො, අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජථ. අඤ්ඤත්‍ර ඛො පනාවුසො, තුම්හෙපි රත්තිභොජනා භුඤ්ජමානා අප්පාබාධතඤ්ච සඤ්ජානිස්සථ අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්චා’’ති.	එම නිසා ඔබලාත් මේ විදියට රාත්‍රී භෝජනය වළක්වලා ආහාර වළඳන්න, එසේ වළඳන ඔබලාටද අබාධ අඩු බවට රෝග අඩු බවට සැහැල්ලු පැවතුම් ඇති බවට කාය බලය සහ පහසු විහරණය ඇතිවීම පිණිස එය හේතු වෙනවා කියලා භික්ෂුන්වහන්සේලා මතක් කළා.
එවං වුත්තෙ, අස්සජිපුනබ්බසුකා භික්ඛූ තෙ භික්ඛූ එතදවොචුං -	ඊට පස්සේ අස්සජි පුනබ්බසුක කියන භික්ෂුන් වහන්සේලා දෙනම ඒ ස්වාමීන්වහන්සේලාට මෙසේ පවසනවා.
‘‘මයං ඛො, ආවුසො, සායඤ්චෙව භුඤ්ජාම පාතො ච දිවා ච විකාලෙ.	ඇවැත්නි අපි හැන්දෑවටත් කනවා, උදේටත් කනවා, දවල් කාලයෙත් විකාලයේත් ආහාර ගන්නවා.

තෙ මයං සායඤ්චෙව භුඤ්ජමානා පාතො ච දිවා ච විකාලෙ අප්පාබාධතඤ්ච සඤ්ජානාම අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්ච.	‘අපි හැන්දෑවටයි උදේටයි දවාලටයි විකාලයේ කෑම ගන්නකොට අපිට ලෙඩ දුක් නැතුව කයට ඇතිවෙන අපහසු තාවයන් නැතුව සැහැල්ලුවෙන්, කාය බලය සහිතව පහසුවෙන් වාසය කරන්න පුළුවන්’.
තෙ මයං කිං සන්දිට්ඨිකං හිත්වා කාලිකං අනුධාවිස්සාම?	ඇවැත්නි, ඉස්සරහදි ලැබෙන්නා වූ ආනිසංසයක් බලාගෙන (**කාලිකං අනුධාවිස්සාම**) අපි මොකටද දැන් තිබෙන සැපය අයින් කරන්නේ? කියලා අස්සජි පුනබ්බසුක දෙනම අහනවා.
සායඤ්චෙව මයං භුඤ්ජිස්සාම පාතො ච දිවා ච විකාලෙ’’ති.	අපි හැන්දෑවටත් කනවා = (සායඤ්ච) උදේටත් කනවා = (පාතො ච) දවාලෙත් කනවා = (දිවා ච). අපි විකාලයේ අහාර ගන්නවා කියලා කියනවා.

යතො ඛො තෙ භික්ඛූ නාසක්ඛිංසු අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ සඤ්ඤාපෙතුං, අථ යෙන භගවා තෙනුපසඞ්කමිංසු; උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං – ‘‘ඉධ මයං, භන්තෙ, යෙන අස්සජිපුනබ්බසුකා භික්ඛූ තෙනුපසඞ්කමිම්හ; උපසඞ්කමිත්වා අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ එතදවොචුම්හ – ‘භගවා ඛො, ආවුසො, අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජති භික්ඛුසඞ්ඝො ච; අඤ්ඤත්‍ර ඛො පනාවුසො, රත්තිභොජනා භුඤ්ජමානා අප්පාබාධතඤ්ච සඤ්ජානන්ති අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්ච. එථ, තුම්හෙපි, ආවුසො, අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජථ. අඤ්ඤත්‍ර ඛො පනාවුසො, තුම්හෙපි රත්තිභොජනා භුඤ්ජමානා අප්පාබාධතඤ්ච සඤ්ජානිස්සථ අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්චා’ති. එවං වුත්තෙ, භන්තෙ, අස්සජිපුනබ්බසුකා භික්ඛූ අම්හෙ එතදවොචුං – ‘මයං ඛො, ආවුසො, සායඤ්චෙව භුඤ්ජාම පාතො ච දිවා ච විකාලෙ. තෙ මයං සායඤ්චෙව භුඤ්ජමානා පාතො ච දිවා ච විකාලෙ අප්පාබාධතඤ්ච සඤ්ජානාම අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්ච. තෙ මයං කිං සන්දිට්ඨිකං හිත්වා කාලිකං අනුධාවිස්සාම? සායඤ්චෙව මයං භුඤ්ජිස්සාම පාතො ච දිවා ච විකාලෙ’ති. යතො ඛො මයං, භන්තෙ, නාසක්ඛිම්හ අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ සඤ්ඤාපෙතුං, අථ මයං එතමත්ථං භගවතො ආරොචෙමා’’ති.

යතො ඛො තෙ භික්ඛූ නාසක්ඛිංසු අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ සඤ්ඤාපෙතුං,	මේ භික්ෂූන් වහන්සේලාට අස්සජි පුනබ්බසුක දෙදෙනාට මේ කාරණය ඒත්තු ගන්වන්න, වටහා දෙන්න නොහැකි උනා = (**නාසක්ඛිංසු**)

බුදුරජාණන් වහන්සේ ජීවත් වෙලා වැඩ ඉන්න කාලයේදීත් ඒ ස්වාමීන්වහන්සේලාට බැරි උනා අස්සජි පුනබ්බසුක කියන දෙන්නට රාත්‍රී ආහාරයෙන් වැලකී සිටීම කියන කාරණය convince කරන්න. මේ ස්වාමීන්වහන්සේලා කියන්න ගියේ බුදුරජාණන්වහන්සේත් භික්ෂු සංඝයාත් රාත්‍රී ආහාරපාන ගැනීමෙන් වැළකී සිටින බව. ඒ කාලයේ ඒ පිළිබඳව ශික්ෂාපදයක් පනවලා තිබුනා. බුදුරජාණන්වහන්සේ රාත්‍රී ආහාරයෙන් වැළකී සිටීම පිළිබඳව ආනිසංසත් දක්වලා තිබෙනවා. බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා කරන්නේ ලෝකය සම්බන්ධයෙන් නොවෙයි. ලෝකයෙන් එතර වීමට. විකාලයේ ආහාර ගැනීමෙන් වැළකිලා පහසුවෙන් ශරීරය පැවත්වීම සසර දුකෙන් මිදෙන්න හේතුවක් හැටියට බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා. චිත්ත දියුණුවක් චිත්ත අධිෂ්ඨානයක් පිණිස සලකලා තමයි මේ ශික්ෂාපදය පනවලා තිබෙන්නේ.

අථ යෙන භගවා තෙනුපසඞ්කමිංසු; උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.	නැවතත් එම භික්ෂූන්වහන්සේලා බුදුරජාණන්වහන්සේ ළඟට වැඩම කළා. බුදුරජාණන්වහන්සේට වන්දනා කරලා පැත්තකින් වාඩි උනා.
එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං -	එසේ හිඳගත් භික්ෂූන්වහන්සේලා බුදුරජාණන්වහන්සේට මෙසේ ප්‍රකාශ කරනවා.
''ඉධ මයං, භන්තෙ, යෙන අස්සජිපුනබ්බසුකා භික්ඛූ තෙනුපසඞ්කමිම්හ;	''ස්වාමිනී භාග්‍යවතුන් වහන්ස, අස්සජි පුන්නබ්බසුක කියන හාමුදුරුවෝ දෙන්නා ගාවට අපි ගියා.
උපසඞ්කමිත්වා අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ එතදවොචුම්හ -	ගිහිල්ලා ඒ අස්සජි පුනබ්බසුක දෙනමට අපි කිව්වා
භගවා ඛො, ආවුසො, අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජති භික්ඛුසඞ්ඝො ච; අඤ්ඤත්‍ර ඛො පනාවුසො, රත්තිභොජනා භුඤ්ජමානා අප්පාබාධතඤ්ච සඤ්ජානන්ති අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්ච. එථ, තුම්හෙපි, ආවුසො, අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජථ. අඤ්ඤත්‍ර ඛො පනාවුසො, තුම්හෙපි රත්තිභොජනා භුඤ්ජමානා අප්පාබාධතඤ්ච සඤ්ජානිස්සථ අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්චා'ති.	බුදුරජාණන්වහන්සේත් භික්ෂු සංඝයාත් රාත්‍රී ආහාරයෙන් වැළකිලා එයින් වෙන්වෙලා ආහාරපාන වළඳනවා, ආබාධ අඩු වීම පිණිසත් කයට ඇතිවෙන අපහසු තාවයන් අඩු වීම පිණිසත් සැහැල්ලු පැවැත්ම පිණිසත් ශරීර බලය පිණිසත් පහසු විහරණය පිණිසත් එය හේතු වෙනවා. ඒක නිසා ඔබලාත් රාත්‍රී ආහාරයෙන් වැළකෙන්න. එය ඔබලාට ආබාධ අඩු වීම පිණිසත් කයට ඇතිවෙන අපහසු තාවයන් අඩු වීම පිණිසත් සැහැල්ලු පැවැත්ම පිණිසත් ශරීර බලය පිණිසත් පහසු විහරණය පිණිසත් එය හේතු වෙනවා.
එවං වුත්තෙ, භන්තෙ, අස්සජිපුනබ්බසුකා භික්ඛූ අම්හෙ එතදවොචුං – 'මයං ඛො, ආවුසො, සායඤ්චෙව භුඤ්ජාම පාතො ච දිවා ච විකාලෙ. තෙ මයං සායඤ්චෙව භුඤ්ජමානා පාතො ච දිවා ච විකාලෙ අප්පාබාධතඤ්ච සඤ්ජානාම අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්ච.	නමුත් අස්සජි පුනබ්බසුක දෙනම ඒක අහලා කිව්වා 'අපි හැන්දෑවටත් උදේටත් දවාලටත් විකාලයේත් ආහාර ගන්නවා'. එය ඔවුනට ලෙඩ දුක් නැතුව කයට ඇතිවෙන අපහසු තාවයන් නැතුව සැහැල්ලු පැවතුම් සහිත කාය බලය සහිතව පහසුවෙන් වාසය කිරිම පිණිස පවතිනවා' කියලා.
තෙ මයං කිං සන්දිට්ඨිකං හිත්වා කාලිකං අනුධාවිස්සාම?	අපි මොකටද ලඟ තිබෙන පහසුව දැක දැක අතහරින්නේ අනාගතය බලාගෙන?
සායඤ්චෙව මයං භුඤ්ජිස්සාම පාතො ච දිවා ච විකාලෙ'ති.	අපි හැන්දෑවටත් කනවා (සායඤ්ච) උදේටත් කනවා (පාතො ච) දවාලෙත් කනවා (දිවා ච). අපි විකාලයේ අහාර ගන්නවා කියලා අස්සජි පුනබ්බසුක දෙදෙනා ප්‍රකාශ කළා.

මෙසේ ප්‍රකාශ කරලා භික්ෂූන්වහන්සේලා නැවත භාග්‍යවත් බුදුරජාණන්වහන්සේට මෙසේද ප්‍රකාශ කරනවා.

යතො ඛො මයං, භන්තෙ, නාසක්ඛිම්හ අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ සඤ්ඤාපෙතුං, අථ මයං එතමත්ථං භගවතො ආරොචෙමා’’ ති.	‘භාග්‍යවත් බුදුරජාණන්වහන්ස අපිට මේ කාරණය අස්සජි සහ පුනබ්බසුක යන දෙදෙනාට අවබෝධ කරන්න නොහැකි වූ බව අපි තථාගතයන් වහන්සේට දන්වා සිටිනවා’ කියලා ප්‍රකාශ කළා.

අථ ඛො භගවා අඤ්ඤතරං භික්ඛුං ආමන්තෙසි – ‘‘එහි ත්වං, භික්ඛු, මම වචනෙන අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ ආමන්තෙහි – ‘සත්ථා ආයස්මන්තෙ ආමන්තෙතී’’’ති. ‘‘එවං, භන්තෙ’’ති ඛො සො භික්ඛු භගවතො පටිස්සුත්වා යෙන අස්සජිපුනබ්බසුකා භික්ඛූ තෙනුපසඞ්කමි; උපසඞ්කමිත්වා අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ එතදවොච – ‘‘සත්ථා ආයස්මන්තෙ ආමන්තෙතී’’ති. ‘‘එවමාවුසො’’ති ඛො අස්සජිපුනබ්බසුකා භික්ඛූ තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු; උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ භගවා එතදවොච – ‘‘සච්චං කිර, භික්ඛවෙ, සම්බහුලා භික්ඛූ තුම්හෙ උපසඞ්කමිත්වා එතදවොචුං – ‘භගවා ඛො, ආවුසො, අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජති භික්ඛුසඞ්ඝො ච. අඤ්ඤත්‍ර ඛො පනාවුසො, රත්තිභොජනා භුඤ්ජමානා අප්පාබාධතඤ්ච සඤ්ජානන්ති අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්ච. එථ, තුම්හෙපි, ආවුසො, අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජථ. අඤ්ඤත්‍ර ඛො පනාවුසො, තුම්හෙපි රත්තිභොජනා භුඤ්ජමානා අප්පාබාධතඤ්ච සඤ්ජානිස්සථ අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්චා’ති. එවං වුත්තෙ කිර, භික්ඛවෙ, තුම්හෙ තෙ භික්ඛූ එවං අවචුත්ථ – ‘මයං ඛො පනාවුසො, සායඤ්චෙව භුඤ්ජාම පාතො ච දිවා ච විකාලෙ. තෙ මයං සායඤ්චෙව භුඤ්ජමානා පාතො ච දිවා ච විකාලෙ අප්පාබාධතඤ්ච සඤ්ජානාම අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්ච. තෙ මයං කිං සන්දිට්ඨිකං හිත්වා කාලිකං අනුධාවිස්සාම? සායඤ්චෙව මයං භුඤ්ජිස්සාම පාතො ච දිවා ච විකාලෙ’’’ති. ‘‘එවං, භන්තෙ’’.

අථ ඛො භගවා අඤ්ඤතරං භික්ඛුං ආමන්තෙසි -	ඒ වේලාවේදී බුදුරජාණන්වහන්සේ එක්තරා භික්ෂුවකට ආමන්ත්‍රණය කළා.
‘‘එහි ත්වං, භික්ඛු,	‘‘මහණ ඔබ මෙහි එන්න,
මම වචනෙන අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ ආමන්තෙහි -	මගේ වචනයෙන්, මම කිව්වා කියලා අස්සජි පුනබ්බසුක කියන හාමුදුරුවෝ දෙන්නට එන්න කියන්න
‘සත්ථා ආයස්මන්තෙ ආමන්තෙතී’’’ ති.	‘ඔබලාට ශාස්තෲන් වහන්සේ කථා කරනවා කියලා’ කියන්න’’.
‘‘එවං, භන්තෙ’’ති ඛො සො භික්ඛු භගවතො පටිස්සුත්වා යෙන අස්සජිපුනබ්බසුකා භික්ඛූ තෙනුපසඞ්කමි;	එහෙමයි භාග්‍යවතුන් වහන්ස, කියලා ඒ භික්ෂූන්වහන්සේ අස්සජි පුනබ්බසුක දෙනම ගාවට ගියා.
උපසඞ්කමිත්වා අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ එතදවොච – ‘‘සත්ථා ආයස්මන්තෙ ආමන්තෙතී’’ති.	අස්සජි පුනබ්බසුක දෙනම ගාවට ගිහිල්ලා ‘ශාස්තෲන් වහන්සේ ඔබලාට එන්න කිව්වා’ කියලා කියනවා.
‘‘එවමාවුසො’’ති ඛො අස්සජිපුනබ්බසුකා භික්ඛූ තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා	‘එසේය’ කියලා අස්සජි පුනබ්බසුක දෙනම බුදුරජාණන් වහන්සේ වෙතට පැමිණියා. ඒ දෙනම භාග්‍යවතුන් වහන්සේ ගාවට වැඩම කරලා

තෙනුපසඞ්කමිංසු; උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.	බුදුරජාණන්වහන්සේට වන්දනා කරලා පැත්තකින් වැඩ සිටිනවා.
එකමන්තං නිසින්නෙ ඛො අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ භගවා එතදවොච -	පැත්තකින් වැඩිවෙලා ඉන්න අස්සජි පුනබ්බසුක කියන භික්ෂූන් වහන්සේලා දෙනමගෙන් බුදුරජාණන්වහන්සේ මෙසේ අසනවා.
''සච්චං කිර, භික්ඛවෙ, සම්බහුලා භික්ඛූ තුම්හෙ උපසඞ්කමිත්වා එතදවොචුං -	''මහණෙනි බොහෝ භික්ෂූන්වහන්සේලා පිරිසක් ඔබලා ගාවට අවිල්ලා මෙහෙම කථාවක් කිව්වද?
'භගවා ඛො, ආවුසො, අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජති භික්ඛුසඞ්ඝො ච. අඤ්ඤත්‍ර ඛො පනාවුසො, රත්තිභොජනා භුඤ්ජමානා අප්පාබාධතඤ්ච සඤ්ජානන්ති අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්ච.	බුදුරජාණන්වහන්සේත් භික්ෂු සංඝයාත් රාත්‍රී ආහාරයෙන් වැළකිලා එයින් වෙන්වෙලා ආහාරපාන වළඳනවා. එසේ වැළකීම ආබාධ අඩු වීම පිණිසත් කයට ඇතිවෙන අපහසු තාවයන් අඩු වීම පිණිසත් සැහැල්ලු පැවැත්ම පිණිසත් ශරීරයේ බලය පිණිසත් පහසු විහරණය පිණිසත් හේතු වෙනවා.
එථ, තුම්හෙපි, ආවුසො, අඤ්ඤත්‍රෙව රත්තිභොජනා භුඤ්ජථ. අඤ්ඤත්‍ර ඛො පනාවුසො, තුම්හෙපි රත්තිභොජනා භුඤ්ජමානා අප්පාබාධතඤ්ච සඤ්ජානිස්සථ අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්චා'ති.	එම නිසා ඔබලාත් රාත්‍රී භෝජනයෙන් වළකින්න. එසේ වැළකීම ඔබලාට ආබාධ අඩු වීම පිණිසත් කයට ඇතිවෙන අපහසු තාවයන් අඩු වීම පිණිසත් සැහැල්ලු පැවැත්ම පිණිසත් ශරීරයේ බලය පිණිසත් පහසු විහරණය පිණිසත් හේතු වෙනවා' කියලා.
එවං වුත්තෙ කිර, භික්ඛවෙ, තුම්හෙ තෙ භික්ඛූ එවං අවචුත්ථ –	ඒ භික්ෂූන් කිව්වහම එවිට ඔබලා මෙසේ කීවාද?
'මයං ඛො පනාවුසො, සායඤ්චෙව භුඤ්ජාම පාතො ච දිවා ච විකාලෙ. තෙ මයං සායඤ්චෙව භුඤ්ජමානා පාතො ච දිවා ච විකාලෙ අප්පාබාධතඤ්ච සඤ්ජානාම අප්පාතඞ්කතඤ්ච ලහුට්ඨානඤ්ච බලඤ්ච ඵාසුවිහාරඤ්ච. තෙ මයං කිං සන්දිට්ඨිකං හිත්වා කාලිකං අනුධාවිස්සාම? සායඤ්චෙව මයං භුඤ්ජිස්සාම පාතො ච දිවා ච විකාලෙ'''ති.	අපි හැන්දෑවටත් උදේටත් දවාලටත් විකාලයේ ආහාර ගන්නවා , එය ඔබලාට ලෙඩ දුක් නැතුව කයට ඇතිවෙන අපහසු තාවයන් නැතුව සැහැල්ලු පැවතුම් සහිත කාය බලය සහිතව පහසුවෙන් වාසය කරන්න පුළුවන්, මොකටද අපි ලඟ තිබෙන සැපයක් දැක දැක එය අතහරින්නේ අනාගතය බලාගෙන? අපි හැන්දෑවටත් උදේටත් දවාලටත් විකාලයේ අහාර ගන්නවා කියලා කිව්වද? කියලා බුදුරජාණන් වහන්සේ ප්‍රශ්න කළා.
එවිට ඔවුහු **''එවං, භන්තෙ''**	''එසේය ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' කියලා පිළිතුරු දුන්නා.

සත්‍යයවාදී වූ තථාගතයන් වහන්සේ ළඟදී කිසිවෙකුට බොරු කියන්න බෑ. ඒ වෙලාවේ බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කරනවා

''කිං නු මෙ තුම්හෙ, භික්ඛවෙ, එවං ධම්මං දෙසිතං ආජානාථ යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්ස අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්තී''ති? ''නො හෙතං, භන්තෙ''. ''නනු මෙ තුම්හෙ, භික්ඛවෙ, එවං ධම්මං දෙසිතං ආජානාථ ඉධෙකච්චස්ස යං එවරූපං සුඛං වෙදනං වෙදයතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්ති, ඉධ පනෙකච්චස්ස එවරූපං සුඛං වෙදනං වෙදයතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති, ඉධෙකච්චස්ස එවරූපං දුක්ඛං වෙදනං වෙදයතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්ති, ඉධ පනෙකච්චස්ස එවරූපං දුක්ඛං වෙදනං වෙදයතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්ති, ඉධෙකච්චස්ස එවරූපං අදුක්ඛමසුඛං වෙදනං වෙදයතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්ති, ඉධ පනෙකච්චස්ස එවරූපං අදුක්ඛමසුඛං වෙදනං වෙදයතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්තී''ති? ''එවං, භන්තෙ''.

''කිං නු මෙ තුම්හෙ, භික්ඛවෙ, එවං ධම්මං දෙසිතං ආජානාථ -	''මහණෙනි මම කාටද මේ වගේ ධර්මයක් දේශනා කළේ?

- යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තස්ස අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්තී''?	''යම් කිසි පුද්ගලයෙක් 'සැප' 'දුක්' 'උපේක්ෂා' යනුවෙන් වේදනා තුනක් විඳිනවා. ඒ 'සැප' 'දුක' 'උපේක්ෂා' කියන වේදනා තුන විඳින කෙනාගේ අකුසල ධර්මයෝ නැති වෙනවා, කුසල ධර්මයෝ වැඩෙනවා කියලා මම කාටද දේශනා කරලා තිබෙන්නේ''? කියලා බුදුරජාණන්වහන්සේ ප්‍රශ්න කරනවා.

මෙතැන තමයි බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනාවට හැරෙන තැන. මේ පින්වතුන්ගේ අවධානය චින්තනය මෙතැනට තිබෙන්න ඕන. මෙතැනදී බුදුරජාණන්වහන්සේ අහනවා ''මහණෙනි මේ වගේ බණක් මම කාටද කවදද කියලා තිබෙන්නේ''? කියලා. මොකක්ද ඒ බණ?

දැන් හොඳට හිතලා බලන්න, අපි සමාන්‍යයෙන් වේදනා කීයක් විඳිනවද? වේදනා තුනයි. සැප වේදනාව, දුක් වේදනාව, උපේක්ෂා වේදනාව. මේ වේදනාවල් විඳීම තුලින් අපේ අකුසල් යට ගිහිල්ලා කුසල් වැඩෙනවද? නෑ, එහෙම එකක් වෙන්නේ නෑ. එහෙම දේශනාවක් නෑ. දැන් බුදුරජාණන්වහන්සේ භික්ෂූන් වහන්සේලාට දේශනා කරනවා පහසුවෙන් ජීවත් වීම පිණිස ආහාර පාන අඩුකරන්න, විකාලයෙන් වළකින්න කියලා. ගොඩක් සැප වේදනාවකට බරව සැප වේදනාවක් අල්ලාගෙන කටයුතු කරනකොට කාගේද අකුසල ධර්ම ප්‍රහාණය වෙන්නේ? කාගේද කුසල ධර්ම වැඩෙන්නේ? බුදුරජාණන්වහන්සේ එහෙම එකක් දේශනා කරලා නෑ. හොඳට සරලව තේරුම් ගන්න, මෙන්න මේකයි මේ කථාව.

යම් කිසි මනුස්සයෙක් ඉන්නවා. ඒ මනුස්සයා වේදනා තුනක් විඳිනවා. ඒ තමයි සැප වේදනාව, දුක් වේදනාව සහ උපේක්ෂා වේදනාව. ඒ වේදනා තුන විඳීමේ මාත්‍රයෙන් එයාගේ අකුසල් යටවීමක්වත් කුසල් වැඩීමක්වත් වෙන්නේ නෑ. මේකයි මෙහි සරල තේරුම.

මේ ප්‍රශ්නය බුදුරජාණන් වහන්සේ ඇසුවහම භික්ෂූන් වහන්සේලා මෙසේ පිළිතුරු දෙනවා'

''නො හෙතං, භන්තෙ''.	''නෑ, භාග්‍යවතුන් වහන්ස'' යනුවෙන් පිළිතුරු දෙනවා

එවිට බුදුරජාණන් වහන්සේ නැවතත් මෙසේ ප්‍රශ්න කරනවා.

"නනු මෙ තුම්හෙ, භික්ඛවෙ, එවං ධම්මං දෙසිතං ආජානාථ -	"මහණෙනි මම මෙහෙම නේද ධර්මය දේශනා කරලා තිබෙන්නේ"

මේක විශේෂ තැනක්.

ඕනෑම කෙනෙකුට එක පදයකින් ධර්මය වෙනස් කරන්න පුළුවන් තැනක්. (tricky point එකක්)

- **ඉධෙකච්චස්ස යං එවරූපං සුඛං වෙදනං වෙදයතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්ති** = මේ ලෝකයේ **සමහර** අයට සැප වේදනාවක් විදීම තුලින් **අකුසල ධර්ම වැඩෙනවා - කුසල ධර්මයෝ පිරිහෙනවා.**

- **ඉධ පනෙකච්චස්ස එවරූපං සුඛං වෙදනං වෙදයතො අකුසලා ධම්මා පරිහායන්ති, කුසලා ධම්මා අභිවඩ්ඪන්ති** = සමහර කෙනෙකුට සැප වේදනාව විදීම තුලින් **අකුසල ධර්මයෝ පිරිහෙනවා - කුසල ධර්මයෝ වැඩෙනවා.**

- **ඉධෙකච්චස්ස එවරූපං දුක්ඛං වෙදනං වෙදයතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්ති** = මේ ලෝකයේ සමහර අයට දුක් වේදනාව විදීම තුලින් අකුසල ධර්මයෝ වැඩෙනවා - කුසල ධර්මයෝ පිරිහෙනවා.

- **ඉධ පනෙකච්චස්ස එවරූපං දුක්ඛං වෙදනං වෙදයතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්ති** = ඒවාගේම සමහර අයට දුක් වේදනාව විදීම තුලින් අකුසල ධර්ම පිරිහෙනවා - කුසල ධර්ම වැඩෙනවා.

- **ඉධෙකච්චස්ස එවරූපං අදුක්ඛමසුඛං වෙදනං වෙදයතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්ති** = මේ ලෝකයේ සමහර අයට උපේක්ෂා වේදනාව විදීම නිසා අකුසල ධර්මයෝ වැඩෙනවා - කුසල ධර්ම පිරිහෙනවා.

- **ඉධ පනෙකච්චස්ස එවරූපං අදුක්ඛමසුඛං වෙදනං වෙදයතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්ති"?** = සමහර කෙනෙකුට උපේක්ෂා වේදනාව විදීමේදී අකුසල ධර්ම පිරිහෙනවා - කුසල ධර්ම වැඩෙනවා.

දැන් බුදුරජාණන්වහන්සේ ප්‍රශ්න කරනවා මේ ක්‍රම හයට නේද මම ධර්මය දේශනා කරලා තිබෙන්නේ, මුලින් ප්‍රකාශ වූ විදියට නොවෙයි නේද? කියලා. "මුලින් ප්‍රකාශ වූ විදියට 'මනුස්සයෙක් සැප වේදනාවක් හෝ දුක් වේදනාවක් හෝ උපේක්ෂා වේදනාවක් විඳිනවා නම් ඒ විදීම තුලින් ඔහුගේ අකුසල ධර්ම ප්‍රහාණය වෙනවා කුසල ධර්මයෝ වැඩෙනවා කියලා කථාවක් මම කියලා නෑ" නේද කියමින් මෙහිදී බුදුරජාණන්වහන්සේ පැහැදිලි කරනවා උන්වහන්සේ ධර්මය දේශනා කොට ඇති ආකාරය.

දැන් මේ **වේදනා හය** පිළිබඳව අපිට තේරෙනවද? කොහොමද අකුසල ධර්ම වැඩෙන්නේ සහ කුසල ධර්ම පිරිහෙන්නේ? මෙහෙම තේරුම් ගන්න. අපි හිතමු මෙහෙට එනවා හුරුබුහුටි පොඩි බල්ලෙක්. ඉතිං අපේ අය තේ බොන වෙලාවට ගිහිල්ලා ඒ පොඩි බලුපැටියා අත ගානවා. එතකොට ඇතිවෙනවා සැප වේදනාවක්. තව එනවා, සුදු පාට හුරු බුහුටි පොඩි ළමයෙක්. එතකොටත් මේ සියලු දෙනාගේම කාරුණික නේත්‍රා යුග්මයන්ට ඒ ළමයා කොටු වෙනවා. එතකොට එතැනටත් ගිහිල්ලා 'බබෝ හරි ලස්සනයි හොඳයි' කියලා අතපත ගානවා වඩා ගන්නවා. එතකොට දැනේනේ සතුටක්ද දුකක්ද? සතුටක්. ඒකත් සුඛ වේදනාවක්. දැන් සුඛ වේදනා දෙකක් තිබෙනවා.

ඊළඟට, මෙතැනට එනවා පොඩි පවුලක්. ඇවිල්ලා අම්මයි තාත්තයි දරුවෙකුයි විහාරයට මල් පූජා කරලා හොඳට සන්තෝසෙන් ඒ තුන් දෙනා ලස්සනට ගාථා කියමින් වන්දනා කරනවා. හොඳට බුදුගුණ සජ්ඣායනා කරමින් වන්දනා කරනවා. එතකොට ඒ ගොල්ලන්ට දැනෙනවා සැපයක්. ඒකත් සැප වේදනාවක්. තව එක්කෙනෙක් නායක හාමුදුරුවන්ට ලංකාවෙන් ගෙනාවා කියලා හරිම සතුටෙන් අෂ්ඨ පරිෂ්කාර පිළිගන්නවා. උන්වහන්සේත් ආශිර්වාද කරනවා. කරපු පිංකම ගැන එයාට හරි සතුටුයි. ඒකත් සැප වේදනාවක්. දැන් සැප වේදනා හතරයි.

දැන් මේ වේදනා හතරෙන් පළවෙනි දෙකේදී එනම් බල්ලා අතගාන කොටත් ළමයා අතගාන කොටත් වැඩෙන්නේ අකුසල්. ඒ වේලාවට කුසල් යට යනවා. දැන් තේරෙනවා නේද සමහර සැප වේදනා තුලින් අකුසල් වැඩෙනවා කුසල් යට යනවා. ඒ වේලාවට ඉන්නේ පන්සලේ කියලවත් තේරෙන්නේ නෑ, ලොකු හාමුදුරුවෝ මේක දකිනවා කියලා මතක් වෙන්නේ නෑ. මේ ක්‍රියාවෙන් අකුසලයක් වැඩෙනවා කියලා මතක් වෙන්නේ නෑ. මේ අනුව සමහර සැප වේදනාවල් නිසා අකුසල් වැඩෙනවා කුසල් යට යනවා.

බුද්ධ වන්දනාවේදී සහ අෂ්ඨපරිශ්කාර පූජාවේදී ඇතිවෙන සැප වේදනාවෙන් අකුසල් යට යනවා කුසල් වැඩෙනවා. ඒක නිසා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා සමහර අයට සැප වේදනාව නිසා අකුසල් වැඩෙනවා කුසල් යට යනවා, සමහර අයට සැප වේදනාව නිසා කුසල් වැඩෙනවා අකුසල් යට යනවා කියලා. 'එහෙම නේද මම ධර්මය දේශනා කරලා තිබෙන්නේ' කියලා තමයි බුදුරජාණන් වහන්සේ මෙලෙස ප්‍රශ්න කරන්නේ.

දැන් බලන්න වෙනස. බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තිබුනා නම් යම් කිසි මනුස්සයෙක් 'සැප වේදනාව විදීම' නිසා 'දුක් වේදනාව විදීම' නිසා සහ 'අදුක්ඛම සුඛ වේදනා විදීම' නිසා අකුසල ධර්ම යට යනවා කුසල ධර්ම වැඩෙනවා කියලා එහෙම නම් බල්ලා අතගාන කොටත් කුසල් වැඩෙන්න ඕන. පොඩි ළමයා අතගාන කොටත් කුසල් වැඩෙන්න ඕන. බුද්ධ වන්දනාවේදීත් කුසල් වැඩෙන්න ඕන. අශ්ඨපරිෂ්කාර පූජාවෙදීත් කුසල් වැඩෙන්න ඕන. නමුත් එහෙම එකක්ද වෙන්නේ? නෑ. ඒක නිසා තමයි මේ වෙනස බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ.

ඉධෙකච්චස්ස එවරූපං දුක්ඛං වෙදනං වෙදයතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්ති.	සමහර අයට දුක්ඛ වේදනාව නිසා අකුසල ධර්ම වැඩෙනවා කුසල ධර්ම පිරිහෙනවා.

කොහොමද අපි ඕක තේරුම් ගන්නේ?

අපි හිතමු කවුරුහරි තමන්ට ගැහුවා කියලා. එතකොට එයා ඒ වෛරය හිතේ තියාගෙන ඉන්නවා. එතකොට එයා ඒ වේදනාව විඳ විඳ අනිත් එක්කෙනාගෙන් පලි ගන්න යනවා. plan කරනවා, ඒ ගැන හිතනවා. ඒකෙන් වෙන්නේ අකුසල ධර්ම වැඩෙනවා, කුසල ධර්ම පිරිහෙනවා.

ඉධ පනෙකච්චස්ස එවරූපං දුක්ඛං වෙදනං වෙදයතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්ති.	සමහර අයට දුක්ඛ වේදනාව නිසා අකුසල ධර්මයෝ පිරිහෙනවා කුසල ධර්මයෝ වැඩෙනවා.

අපි කොහොමද මේක තේරුම් ගන්නේ?

අපි ඕලාරික උපමාවක් අරගෙන හිතමු. කෙනෙක් මහණ වෙන්න යනවා. එතකොට එයා එයාගේ cell phone එක අතහැරලා යන්නේ, ඔරලෝසුව, කමීසය, කලිසම, දෙමව්පියෝ, දූ දරුවෝ සියල්ලම

අතහැරලා යන්නේ. එහෙම අතහැරලා යනකොට එයාට සැප වේදනාවක්ද දැනේනේ? නෑ, දුක් වේදනාවක් දැනෙන්නේ. නමුත් එයා ඒ වේදනාව විඳගෙන ගිහිල්ලා මහණවෙලා පසු කාලීනව අමාරුවෙන් භාවනා කරලා ඒ දුකෙන් නිදහස් වෙනවා. ඒකෙන් එයා කුසල් වඩා ගන්නවා. මෙවැනි සමහර දුක්ඛ වේදනාවල් තිබෙනවා අකුසල් ධර්ම පිරිහෙන, කුසල ධර්ම වැඩෙන.

බුදුරජාණන්වහන්සේ දේශනා කරපු ධර්මය උන්වහන්සේ අබබෝධ කරගත්තේ වනාන්තරයේ ගහක් යට ඉඳගෙනද නැත්නම් 5 - star හෝටලේක ඉඳලද? වනාන්තරේ ඉඳලා. උන්වහන්සේ භාවනා කළේ වනාන්තරේ ඉඳලා. ආහාර පාන එහෙමත් අඩුයි. එක බත් ඇටයක් වගේ ගත්ත අවස්ථාත් තිබුනා. උන්වහන්සේ කොහොම හරි කෙලෙස් නසා ජය ගත්තා. කවදාකවත් උන්වහන්සේ රජ මාළිගාවක හරි 5 -star හෝටලේක හිටියේ නෑ. ඒ කාලේ ඒවා තිබුනෙත් නෑ. උන්වහන්සේ මාළිගා ඊට වඩා සැප සම්පත් තිබුන තැනක්. අතට පයට සේවකයෝ ගොඩක් හිටියා. දැන් සමහර විපස්සනා වැඩ සටහන් තිබෙනවා 5 – star හෝටල්වල. ඒවාට ගිහිල්ලා ඒ අය දෙන එකක් කාල බීලා පහසුවෙන් ඉඳලා භාවනාවෙන් දියුණු උනා කියලා හිතාගෙන එනවා. ඒ කියන්නේ ඒ අයට දුක දරාගැනීමේ ශක්තිය හරි අඩුයි. ඇත්තටම එයින් දියුණු උනේ කුමක්ද කියලා අපිට හිතන්න සිද්ධ වෙනවා.

අපි හිතමු මදුරුවෙක් අපිව කනවා. ඒ මදුරුවා කනකොට අපිට ඇතිවෙන්නේ දුක්ඛ වේදනාවක්. නමුත් අපි මදුරුවා කන එක ඉවසාගෙන මදුරුවා මරන්නේ නැතුව හෙමිහිට අයින් කරනවා. එතනදී අපිට වේදනාවක් තිබුනා. නමුත් අපි ඒ වේදනාවට ප්‍රතිචාර දැක්වූයේ ඉවසීමෙන්, සත්ව ඝාතනයකට හසු වෙන්නේ නැතිව සීලයත් ආරක්ෂා කරමින්. ඒ වේදනාව නිසා කුසල ධර්ම වැඩුනා අකුසල් ධර්ම යට ගියා.

ඔය විදියට සමහර දුක්ඛ වේදනාවල් වලින් කුසල් වැඩෙනවා අකුසල් යට යනවා.

නැවතත් අදුක්ඛමසුඛ වේදනාව ගැන බුදුරජාණන්වහන්සේ මෙසේ දේශනා කරනවා.

ඉධෙකච්චස්ස එවරූපං අදුක්ඛමසුඛං වෙදනං වෙදයතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්ති, ඉධ පනෙකච්චස්ස එවරූපං අදුක්ඛමසුඛං වෙදනං වෙදයතො අකුසලා ධම්මා පරිහායන්ති කුසලා ධම්මා අභිවඩ්ඪන්ත	උපේක්ෂා වේදනාව නිසාත් සමහර අයට අකුසල ධර්ම වැඩෙනවා කුසල ධර්ම පිරිහෙනවා. සමහර අයට අකුසල ධර්ම පිරිහෙනවා කුසල ධර්ම වැඩෙනවා.

අපි බලමු මේක තේරුම් ගන්න. අපි සමහර දේවල් නොසලකා හරිනවා. උදා: ලෙස අපි තථාගතයන් වහන්සේ දේශනා කළ ශික්ෂාපද එහෙම එච්චර ගණන් ගන්නේ නෑ. ඔහොම ඉන්නකොට උපේක්ෂා වේදනාවක් එන්න පුළුවන්. ඒ කියන්නේ මධ්‍යස්ථ වේදනාවක්. නමුත් එයා ඒකෙන් කරන්නේ අකුසලයක්. එවැනි මධ්‍යස්ථ වේදනා වලින් අකුසලය වැඩෙනවා, කුසලය පිරිහෙනවා.

මේ අයුරින් බුදුරජාණන්වහන්සේ 'සැප වේදනාවෙන්' 'දුක්ඛ වේදනාවෙන්' සහ 'උපේක්ඛා වේදනාවෙන්' යන වේදනා තුනෙන් අකුසල් වැඩෙන විදියත් කුසල් පිරිහෙන විදියත්, කුසල් වැඩෙන විදියත් අකුසල් පිරිහෙන විදියත් දේශනා කරලා "මහණෙනි මම මේ විදියට නේද ඔබලාට ධර්මය දේශනා කළේ" කියලා ප්‍රශ්න කරනවා.

එතකොට භික්ෂූන් වහන්සේලා **"එවං, භන්තෙ"** = 'එහෙමයි ස්වාමීන්වහන්ස' කියලා පිළිතුරු දෙනවා. එවිට බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කරනවා.

"සාධු, භික්ඛවෙ! මයා චෙතං, භික්ඛවෙ, අඤ්ඤාතං අභවිස්ස අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං	" මහණෙනි මම මේ කාරණය එනම් සැප වේදනාවෙන් අකුසල් ධර්ම වැඩෙන විදියත්

පඤ්ඤාය – 'ඉධෙකච්චස්ස එවරූපං සුඛං වෙදනං වෙදයතො අකුසලා ධම්මා අභිවඩ්ඪන්ති කුසලා ධම්මා පරිහායන්තී'ති, එවාහං අජානන්තො 'එවරූපං සුඛං වෙදනං පජහථා'ති වදෙය්‍යං; අපි නු මෙ එතං, භික්ඛවෙ, පතිරූපං අභවිස්සා''ති?	කුසල ධර්ම පිරිහෙන විදියත් දැන ගන්නේ නැතුව, දැක ගන්නේ නැතුව, අවබෝධ නොකොට, සාක්ෂාත් කොට නොගෙන, මම කියනවා නම් සුඛ වේදනාවෙන් අකුසල් වැඩෙනවා කුසල ධර්මයෝ පිරිහෙනවා කියලා ඒක මට ගැලපෙනවද? කියලා ප්‍රශ්න කරනවා.

එවිට භික්ෂූන් වහන්සේලා **''නො හෙතං, භන්තෙ''** පිළිතුරු දෙනවා. බුදුරජාණන් වහන්සේලා කසිම දෙයක් ප්‍ර ත්‍යක්ෂ නොකොට දේශනා කරන්නේ නෑ.

සමහර වේලාවට දොස්තරවරුත් කියනවා නේද ආහාරපාන අඩු කරන්න කියලා? කොසොල් රජ්ජුරුවන්ටත් ප්‍රශ්නයක් තිබුනා. ඒ රජ්ජුරුවෝ දවසකට ලොකු කෑම වේලක් කනවලු. ඒ රජ්ජුරුවන්ට ලොකු බඩක් තිබුනා. ඒක නිසා යා ගන්න හරි අමාරුයි, හරියට වාඩි වෙන්නත් බෑ. දවසක් බුදුරජාණන්වහන්සේ ගාව වාඩිවෙලා ඉන්නවා හරි අමාරුවෙන්. එතකොට බුදුරජාණන්වහන්සේ ''මහ රජ ඔබ අපහසුවෙන් නේද ඉන්නේ'' කියලා ඇහුවහම රජ්ජුරුවෝ 'එහෙමයි ස්වාමීනී' කියලා පිළිතුරු දුන්නා. එතැනදී බුදුරජාණන් වහන්සේ දේශනා කළා රජ්ජුරුවන්ට ආහාර අඩුකරන ක්‍රමයක්. එකපාරම අඩු කරන්න එපා කිව්වා. දවසකට සතියකට මාසයකට ටික ටික අඩුකරන හැටි කියලා දුන්නා. අන්තිමට නැළියට බස්සා ගත්තා. ඊට පස්සේ රජ්ජුරුවන්ට පහසුවෙන් කටයුතු කරගන්න පුළුවන් උනා.

බුදුරජාණන්වහන්සේලා කිසිම දෙයක් හිතලා දේශනා කරන්නේ නැහැ. රාත්‍රී භෝජනයෙන් වළකින්න කියන කථාව බුදුරජාණන්වහන්සේ අනුමාන කරලා හිතලා කියපු එකක් නොවෙයි. උන්වහන්සේ ප්‍රත්‍යක්ෂ කරලා හොඳට ඥානයෙන් නුවණින් දැකලා තමයි දේශනා කරන්නේ. දැන් අපි මේ සූත්‍රය ඉදිරිපත් කර ගන්නේ නැතුව 'බුදුරජාණන්වහන්සේ මෙහෙමයි දේශනා කරලා තිබෙන්නේ' කියලා කියන්නේ නැතුව අපිට හිතෙන ඕනෑම දෙයක් කිව්වොත් ඒක ගැලපෙන්නේ නෑ. මේ කරුණු අපි කියන ඒවා නොවෙයි. අපිට හිතෙන හිතළු නොවෙයි මේවා. ඒක නිසා අපි, මේ සූත්‍රවල කියලා තිබෙන විදිය, උන්වහන්සේගේ පරීක්ෂණ, උන්වහන්සේගේ ඥානයෙන් දැකපු දේවල් ඒ අයුරින්ම ප්‍රකාශ කරන්න ඕනෑ. ඒක තමයි සත්‍යවාදී බව.

මේ අයුරින් 'සැප වේදනාව සම්බන්ධයෙනුත්' 'දුක්ඛ වේදනාව සම්බන්ධයෙනුත්' 'අදුක්ඛම සුඛ වේදනාව සම්බන්ධයෙනුත්' බුදුරජාණන්වහන්සේ මේ විදියටම භික්ෂූන් වහන්සේලාගෙන් අහනවා, ''සැප වේදනාව ගැන දන්නේ නැතුව, දුක්ඛ වේදනාව ගැන දන්නේ නැතුව, අදුක්ඛම සුඛ වේදනාව ගැන දන්නේ නැතුව හොයන්නේ නැතුව පරීක්ෂා කරන්නේ නැතුව එය නුවණින් දැක අවබෝධ කරගන්නේ නැතුව යම් කිසි දෙයක් මම කියන්න ගියානම් ඒක සුදුසු නෑ නේද'' කියලා. ඒ හැම අවස්ථාවකදීම භික්ෂූන්වහන්සේලා ප්‍රකාශ කරනවා ''සුදුසු නෑ ස්වාමීන්වහන්ස'' කියලා.

ඊළඟට බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා

''නාහං, භික්ඛවෙ, සබ්බෙසංයෙව භික්ඛූනං 'අප්පමාදෙන කරණීය'න්ති වදාමි; න පනාහං, භික්ඛවෙ, සබ්බෙසංයෙව භික්ඛූනං 'න අප්පමාදෙන කරණීය'න්ති වදාමි. යෙ තෙ, භික්ඛවෙ, භික්ඛූ අරහන්තො ඛීණාසවා වුසිතවන්තො කතකරණීයා ඔහිතභාරා අනුප්පත්තසදත්ථා පරික්ඛීණභවසංයොජනා සම්මදඤ්ඤා විමුත්තා, තථාරූපානාහං, භික්ඛවෙ, භික්ඛූනං 'න අප්පමාදෙන කරණීය'න්ති වදාමි. තං කිස්ස හෙතු? කතං තෙසං අප්පමාදෙන. අභබ්බා තෙ පමජ්ජිතුං. යෙ ච ඛො තෙ, භික්ඛවෙ, භික්ඛූ සෙක්ඛා අප්පත්තමානසා අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානා විහරන්ති, තථාරූපානාහං, භික්ඛවෙ, භික්ඛූනං 'අප්පමාදෙන කරණීය'න්ත්න්ත්ති වදාමි. තං කිස්ස හෙතු? අප්පෙව නාමිමෙ ආයස්මන්තො අනුලොමිකානි සෙනාසනානි පටිසෙවමානා කල්‍යාණමිත්තෙ භජමානා ඉන්ද්‍රියානි සමන්නානයමානා –

යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං – බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යුන්ති! ඉමං ඛො අහං, භික්ඛවෙ, ඉමෙසං භික්ඛූනං අප්පමාදඵලං සම්පස්සමානො ‘අප්පමාදෙන කරණීය’න්ත්න්ත්ති වදාමි.

‘‘නාහං, භික්ඛවෙ, සබ්බෙසංයෙව භික්ඛූනං ‘අප්පමාදෙන කරණීය’න්ති වදාමි’’;	‘‘මහණෙනි මම සියලුම භික්ෂූන් වහන්සේලාට අප්‍රමාදීව කටයුතු කරන්න ඕනැම කියලා කියන්නේ නෑ’’

‘‘න පනාහං, භික්ඛවෙ, සබ්බෙසංයෙව භික්ඛූනං ‘න අප්පමාදෙන කරණීය’න්ති වදාමි’’.	‘‘ඒවගේම තමයි සියලුම භික්ෂූන් වහන්සේලාට අප්‍රමාදීව කටයුතු නොකරන්න කියලා කියන්නෙත් නෑ’’

යෙ තෙ, භික්ඛවෙ, භික්ඛූ අරහන්තො ඛීණාසවා වුසිතවන්තො කතකරණීයා ඔහිතභාරා අනුප්පත්තසදත්ථා පරික්ඛීණභවසංයොජනා සම්මදඤ්ඤා විමුත්තා, තථාරූපානාහං, භික්ඛවෙ, භික්ඛූනං ‘න අප්පමාදෙන කරණීය’න්ති වදාමි.	මහණෙනි, රහත් වූ ඛීණාශ්‍රව භික්ෂූන් වහන්සේ සියලු කටයුතු කළා වූ රහත් බවට පත් උනාවූ කෙලෙස් බර බහා තැබුවා වූ උතුම් වූ ධර්මයන්ට පත් උනා වූ භව සංයෝජනයන් නැති කළා වූ සියලුම ධර්මයන් යහපත්ව දැක අවබෝධ කරගෙන මිදී ගියා වූ රහත් භාවයට පත් උනා වූ භික්ෂූන් වහන්සේලාට ‘අප්‍රමාදීව කටයුතු කරන්න’ කියලා මම කියන්නේ නෑ’’

තං කිස්ස හෙතු? = හේතුව කුමක්ද?
කතං තෙසං අප්පමාදෙන. = ඒ රහතන්වහන්සේලා අප්‍රමාදයෙන් කරන්න තිබෙන සියලුම දේ කරලා ඉවරයි.
අභබ්බා තෙ පමජ්ජිතුං. = ඒ අය ප්‍රමාද වීමට සුදුසු අය නොවෙයි. (රහතන්වහන්සේලා ස්වභාවයෙන්ම අප්‍රමාදීයි)

යෙ ච ඛො තෙ, භික්ඛවෙ, භික්ඛූ සෙක්ඛා අප්පත්තමානසා අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානා විහරන්ති, තථාරූපානාහං, භික්ඛවෙ, භික්ඛූනං ‘අප්පමාදෙන කරණීය’න්ත්න්ත්ති වදාමි.	මහණෙනි, යම් කිසි ශෛක්‍ෂ වූ භික්ෂූන් වහන්සේලා පිරිසක් වේද, රහත් භාවයට පත් නොවුනා වූ රහත් භාවයට පත් වෙන්න අපේක්ෂාවෙන් ප්‍රාර්ථනාවෙන් ඉන්න, ඒ භික්ෂූන් වහන්සේලාට අප්‍රමාදීව කරයුතු කරන්න කියලා මම කියනවා’’

තං කිස්ස හෙතු? = හේතුව කුමක්ද?

දැන් හොඳට බලන්න, රහතන්වහන්සේලාට බුදුරජාණන්වහන්සේ දේශනා කරන්නේ නෑ අප්‍රමාදීව කටයුතු කරන්න කියලා. තවත් ඉන්නවා ‘සේඛ’ භික්ෂූන් වහන්සේලා. සේඛ කියලා කියන්නේ රහත් භාවයට පත් වෙන්න තවත් කටයුතු කළ යුතු ස්වාමීන්වහන්සේලා. ඒ ස්වාමීන්වහන්සේලා නිවන් අපේක්ෂාවෙන් කටයුතු කරන ස්වාමීන්වහන්සේලා.

අප්පෙව නාම්මෙ ආයස්මන්තො = ඒ සේඛ භික්ෂූන් වහන්සේලාට
අනුලොමිකානි සෙනාසනානි පටිසෙවමානා = සුදුසු සේනාසන වල වැඩ ඉඳගෙන
කල්‍යාණමිත්තෙ භජමානා = කල්‍යාණ මිත්‍රයන් ආශ්‍රය කරමින්

ඉන්ද්‍රියානි සමන්නානයමානා = ශ්‍රද්ධාව වීර්ය සති සමාධි ප්‍රඥා යන ඉන්ද්‍රිය ධර්මයන් සම කරමින්......

ඉන්ද්‍රිය ධර්මයන් සම කිරීම කියල කියන්නේ, සමහර අය ඉන්නවා ශ්‍රද්ධාව වැඩියි, සමහර අයගේ ප්‍රඥාව වැඩියි, සමහර අයගේ වීර්ය වැඩියි, සමහර අයගේ සමාධිය වැඩියි. මේ වගේ වෙනස්කම් තිබෙනවා. සමහර අයගේ ශ්‍රද්ධාව වැඩියි, ප්‍රඥාව මදි. ඒ අය මොකක් හරි එන කබල් බස් එකක එල්ලෙනවා. ඒක පිටකොටුවට යන එකක්ද අංගොඩ යන එකක්ද මුල්ලේරියාවේ යන එකක්ද කියලා මොකක්වත් බලන්නේ නෑ. ඒවගේ ශ්‍රද්ධාව වැඩි උනහම මොකක් හරි දෙයක් භාර ගන්නවා. ප්‍රඥාවෙන් තුලනය කරලා බලන්නේ නෑ. සමහරුන්ට ප්‍රඥාව, චින්තනය තිබෙනවා, ශ්‍රද්ධාව හරි අඩුයි. ඒ අය විද්‍යාවයි ඔක්කොමයි දාන්න ගිහිල්ලා බුදුරජාණන්වහන්සේගේ දේශනාව ගැනවත් තකන්නේ නෑ. ශ්‍රද්ධාව වැඩි වෙලා ප්‍රඥාව අඩු උනොත් එන හැම එකකම එල්ලෙනවා. ශ්‍රද්ධාව අඩුවෙලා ප්‍රඥාව වැඩි උනොත් මොන මොනවා හරි කියනවා. තර්ක කරනවා. තර්කය තමයි ඒ අයගේ එකම නියාය. නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ **ඉන්ද්‍රියානි සමන්නානයමානා** කියලා. ඒක නිසා ශ්‍රද්ධාවට ප්‍රඥාව සම වෙන්න ඕන. සමාධියට වීර්ය සමවෙන්න ඕන.

යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං – බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යුන්ති!	බුදුරජාණන් වහන්සේගේ ධර්මය අවබෝධ කරගැනීමේ බලාපොරොත්තුවෙන් ගිහිගෙය අත්හැරලා පැවිදි වුනා වූ ඒ ශ්‍රාවයක් වහන්සේලාට මේ ජීවිතියේදීම රහත් භාවයට පත් වෙලා වාසය කරන්න පුළුවන්, මෙලෙස කටයුතු කලවිට.

ඉමං ඛො අහං, භික්ඛවෙ, ඉමෙසං භික්ඛූනං අප්පමාදඵලං සම්පස්සමානො ‘අප්පමාදෙන කරණීය’න්ත්න්ත්ති වදාමි.	ඒක නිසා මම සේඛ භික්ෂුන් වහන්සේලාට අප්‍රමාදී ඵලය වූ රහත් භාවය ලබා ගැනීමට මේ ටික කරන්න කියලා සඳහන් කරනවා.

මෙම කීටාගිර සූත්‍රයේ සේඛ පුද්ගලයන්ට ඉහළ තැන් වලට පත් වෙන්න කරුණු තුනක් පැහැදිලි කරනවා.

1) අනුලොමිකානි සෙනාසනානි = සුදුසු සේනාසන
2) කල්‍යාණමිත්තෙ භජමානා = කල්‍යාණ මිත්‍ර ආශ්‍රය
3) ඉන්ද්‍රියානි සමන්නානයමානා = ඉන්ද්‍රිය සමතාවය

ඊළඟට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා

‘‘සත්තිමෙ, භික්ඛවෙ, පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ සත්ත? උභතොභාගවිමුත්තො, පඤ්ඤාවිමුත්තො, කායසක්ඛි, දිට්ඨිප්පත්තො, සද්ධාවිමුත්තො, ධම්මානුසාරී, සද්ධානුසාරී	මහණෙනි මේ ලෝකයේ පුද්ගලයෝ හත් දෙනෙක් ඉන්නවා.

(මේ කොටස ටිකක් දිග නිසා ඊළඟ අවස්ථාවේදී සාකච්ඡා කරමු)

වේදනාවේ ධර්මතා දෙකක් තිබෙනවා. ඒ තමයි ‘ගෙහසිත වේදනාව’ සහ ‘නෙක්ඛම්ම සිත වේදනාව’. එක වේදනාවකින් කෙලෙස් වැඩෙනවා. ඒකට කියනවා ‘ගෙහ සිත වේදනාව’ කියලා. එක වේදනාවකින් කෙලෙස් නැති වෙනවා. ඒකට කියනවා ‘නෙක්ඛම්ම වේදනාව කියලා’. මේ වේදනා දෙක තමයි ඉස්සෙල්ලා විස්තර කළේ.

අපි රංගන ශාලාවක රංගනයක් බලන අවස්ථාවකදී අපිට ඇතිවෙන්නේ සැප වේදනාවක්. නමුත් ඒ වේදනාවෙන් වැඩෙන්නේ අකුසල්. අපි සෝමාවතිය වඳින්න යනවා. සෝමාවතියට යනකොට ඒ ගමන ටිකක් අමාරුයි, දුක්ඛිතයි. ඒ දැනෙන අපහසුතාවය දුක්ඛ වේදනාවක්ම තමයි. නමුත් ඒ වේදනාවෙන් වුවත් රැස් වෙන්නේ කුසල්. මේ වේදනා දෙක යෙදෙන විදිය ඉදිරියේදී තව විස්තර වෙනවා.

හොඳයි දැන් මේ කියපු ටිකෙන් ප්‍රශ්න එහෙම තිබෙනවා නම් අහන්න පුළුවන්.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස නෙක්ඛම්ම නිරාමිස කියන්නේ එකමද?

<u>පිළිතුර</u> - නෙක්ඛම්ම සුඛය, නිරාමිස සුඛය කියලා කියන්නේ ආමිසය ලංකරගත්තේ නැති සැපය. ඒ දෙක සමානයි. ගෙහසිත කියලා කියන්නේ ඇලීම් සහගත කියන එක.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස උපේක්ෂා වේදනාව තේරුම් ගන්න අමාරුයි.

<u>පිළිතුර</u> - උපේක්ෂා වේදනාවට ප්‍රඥාව අවශ්‍යයි. අපි බිත්තියක් දිහා බලාගෙන ඉන්නකොටත් මොකක් හරි වේදනාවක් තිබෙනවා. අපි බලන හැම දේකින්ම වේදනාවක් දැනෙනවා. වේදනාවක් දැනේනේ නැති එකම දෙයක්වත් නෑ. දැනුත් වේදනාවක් දැනෙනවා. අහස දිහා බැලුවහමත් අපිට වේදනාවක් දැනෙනවා. වේදනා විඳින ගතියක් හැදෙනවා. ඒ වේදනා විඳින ගතිය සැප වේදනාවක් නොවෙන නිසාත් දුක්ඛ වේදනාවක් නොවෙන නිසාත් තේරුම් ගැනීම අමාරුයි. නමුත් ඒ දෙස බලාගෙන ඉන්නකොට අපිට දැනෙනවා වේදනාවක් තිබෙන බව. ඒ වේදනාව හඳුනා ගන්න බැරි උපේක්ෂා සහගත නිසයි.

සමහර උපේක්ෂා සහගත වේදනාවල් වලින් කුසල් වැඩෙනවා. සමහර උපේක්ෂා සහගහ වේදනාවල් වලින් අකුසල් වැඩෙනවා. අපි හිතමු සතෙක් තව සතෙක් ඩැහැගෙන යනවා. සමහර වෙලාවට අපිට ඒ සතාව බේරන්න බැරි අවස්ථාත් තිබෙනවා, බේරන්න පුළුවන් අවස්ථාත් තිබෙනවා. බේරන්න බැරි අවස්ථාවලදී අපි දුක් වෙනවා. ඒක සෝකයක්. යම් කිසි සියුම් තරහක් ඇතිවෙනවා. ඒක කරුණාව නොවෙයි. ඒ වේලාවට 'මේකට මට කරන්න දෙයක් නෑ, ඒ සත්වයාගේ කර්මයක් ගෙවී යනවා, තව කෙනෙක් කර්මයක් රැස් කර ගන්නවා. ඒක තමයි මෙතැන තිබෙන ධර්ම ස්වභාවය කියලා' මම උපේක්ෂා සහගත වෙනවා. එතකොට මම සතෙකුට වෛරය කලෙත් නෑ. මම තරහක් හදාගත්තෙත් නෑ. මම එතනදී ධර්මයකට පරිවර්තනය උනා. ආන්න ඒතැනදී උපේක්ෂාවෙන් කුසල් වැඩෙනවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ආයතන ගැන ඉගෙන ගන්නකොට කියනවනේද වේදනාවට යන්නේ නැතුව සපර්ශ වෙන තැනදී නවත්වනවා නම් හොඳයි කියලා.

<u>පිළිතුර</u> - කොහේවත් වේදනාව නවත්වන්න කියලා නෑ. එහෙම බණ නෑ. වේදනාවක් දැනෙනවා. දැන් මෙතන පිරිසක් ඉන්නවා. අපි හැම එක්කෙනාටම තිබෙනවා පංච ස්කන්ධයක්. එතකොට මේ පංච ස්කන්ධ වල අපි පුරුදු කරපු ස්වභාව එකින් එක්කෙනාට වෙනස්. අපි පුරුදු කරපු දේවල් එකින් එකට වෙනස්. සමහරුන්ගේ ශ්‍රද්ධාව වැඩියි. සමහරුන්ගේ ඥානය වැඩියි. සමහරුන්ගේ වීර්ය වැඩියි. සමහරුන්ගේ සමාධිය වැඩියි. ඔහොම ස්වභාවයක් තිබෙන්නේ. විදර්ශනා කරන්න ගියහම අපිට වැටහෙන වැටහීම්, රූපය වේදනාව සප්ර්ශය සංඥාව විඤ්ඤාණය බලන්න ගියහම අපිට දැනෙන දැනීම් එක්කෙනාගෙන් එක්කෙනාට වෙනස්. සමහර කෙනෙකුට වේදනාව හරි පැහැදිලියි. හරි පහසුවෙන් දැනෙනවා. සමහර කෙනෙකුට හොඳට දැනෙනවා හිත, විඤ්ඤාණය. සමහර කෙනෙකුට ස්පර්ශය තේරෙනවා. හැපෙන කොට වැදෙන කොට මේ ස්පර්ශ ගතියයි කියලා තේරෙනවා. සමහරුන්ට සංඥාව තේරෙනවා. සමහර කෙනෙකුට ඕවා එකක්වත් අහුවෙන්නේ නැතුව රූපය අහුවෙනවා. ඒක නිසා බුදුරජාණන්වහන්සේ ඔය ස්පර්ශය ගැන මෙනෙහි කරන්න ධර්ම දේශනා කරලා තිබෙන්නේ ආන්න ඒ track එකේ වැඩ කරන්නා වූ කෙනෙකුටයි. සමහර කෙනෙකුට එහෙම නෑ. අපි හැම එක්කෙනාගේම understanding capacity එක හරිම වෙනස්.

<u>ප්‍රශ්නය </u>- ස්වාමීන්වහන්ස සුදුසු සෙනසුන් කියල කියන එකෙන් කිව්වේ?

<u>පිළිතුර</u> - එතැන කරුණු තුනක් කියවෙනවා.

1) **අනුලොමිකානි සෙනාසනානි පටිසෙවමානා** = සුදුසු සේනාසන සේවනය කරමින්, ඒ කියන්නේ මිනිස්සු ගැවසෙනවා අඩු සේනාසන. සමහර සේනාසන තිබෙනවා බල්ලෝ ඉන්න. ඒ බල්ලෝ හැමවේලේම බුරනවා. ඒක හරි කරදරයි. එහෙම නැති ශාන්ත සුන්දර සේනාසන සේවනය කළ යුතුයි.

2) **කල්‍යාණමිත්තෙ භජමානා** = කල්‍යාණ මිත්‍රයන් ආශ්‍රයකරමින්

3) **ඉන්ද්‍රියානි සමන්නානයමානා** = ඉඳුරන් සමනය කරමින් (ශ්‍රද්ධා විරිය සති සමාධි ප්‍රඥා)

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අර ඡබ්බග්ගිය භික්ෂුන් වහන්සේලා හය දෙනාට පස්සේ මොකද උනේ?

<u>පිළිතුර</u> - ඒ අයගෙන් අස්සජි පුනබ්බසුක යන භික්ෂුන් වහන්සේලා දෙන්නටම හිටියා විශාල පිරිස්. ඒ අය පිරිස් වල නායකයෝ. ඒ අය නම් ඔය කියන කරුණු එක්ක ටිකක් ලැජ්ජාවට වගේ හැදිච්ච ගතිය තිබුනා. අනිත් අයට වෙච්ච දෙයක් ගැන කියන්නේ නෑ.

ඒ අය සාසනේ මාර්ග ඵල ලැබුවේ නැත්ද?

<u>පිළිතුර</u> - නෑ ඒ අය කළේ ඔක්කොම notorious වැඩ. බුදුරජාණන්වහන්සේ ඒ අයට අමතලා තිබෙන්නේ හිස් පුරුෂයා, මෝඝ පුරුෂයා, තුච්ඡ පුරුෂයා කියලා. එයාලගේ භාර්යාවරුත් එහෙමයි. ඒ අය ඔක්කොම ලෙහෙසියෙන් ජීවිත පැවැත්ම ගෙන යන්න එකතු වෙච්ච කොටසක්.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස රාත්‍රී ආහාරය නවත්වන්න කියලා ශික්ෂාපදය පැනෙව්වහම 'මට රෑට කන්නේ නැතුව ඉන්න බෑ' කියලා කිව්වේ මේ කට්ටියගෙන් කවුරුහරි කෙනෙක්ද?

<u>පිළිතුර</u> - භද්දාලි කියලා හාමුදුරුවෝ කෙනෙකුටත් උනා එහෙම. භද්දාලි හාමුදුරුවෝ සම්බන්ධයෙන් තිබෙන්නේ වෙන කාරණයක්. මෙයට සමානයි. මෙහෙමයි උනේ. බුදුරජාණන් වහන්සේ දේශනා කළා එකාසනභෝජනය වළඳන්න කියලා. ඒ කියන්නේ දවසට ගන්න ආහාර ප්‍රමාණය එක ආසනයක ඉඳලා වළඳන්න කියලා. භද්දාලි හාමුදුරුවෝ කිව්වා බෑ කියලා. ඊට පස්සේ බුදුරජාණන්වහන්සේ කිව්වා පිණ්ඩපාතයේ වැඩම කරලා උදේට දානය වළඳලා ඉතිරි ටික අරගෙන ඇවිල්ලා පස්සේ වළඳන්න කියලා. දෙකම බෑ කිව්වා. තුන් මාසයක්ම බුදුරජාණන් වහන්සේ දකින්න හම්බ උනේ නෑ. එතකොට භික්ෂුන් වහන්සේලා ගිහිල්ලා කිව්වා 'ඔබ කොච්චර අපරාදයක්ද කර ගත්තේ, තථාගතයන් වහන්සේ දකින්න වඳින්න තිබෙන එකත් නැති කරගත්තා නේද' කියලා. ඒ කාලයේ ස්වාමීන්වහන්සේලා බුදුරජාණන්වහන්සේට සිවුරක් මහනවා. ඒ පාර භද්දාලි ස්වාමීන්වහන්සේ බුදුරජාණන්වහන්සේ ගාවට ගිහිල්ලා සමාව ගන්නවා. ඒ වේලාවේ බුදුරජාණන් වහන්සේ කරුණු පහදලා දුන්නා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස මත්පැන් පානය කිරීම වැනි වැරදි දේවල් කළහම මහණ කමෙන් අස්වෙන්න කියලා නීතියක් නැත්ද?

<u>පිළිතුර</u> - අධිසීල සංඛාත උපසම්පදා සීලයෙහි පිහිටියහම පාරාජිකා බවට පත්වෙනකම්ම ප්‍රතික්ෂේප කරන්නේ නෑ. උපසම්පදා භික්ෂුන් වහන්සේ කෙනෙකුට තිබෙන්නේ අධි සීලයක්. ගිහි මනුස්සයෙක් මොන දෙයක් කරත් ඒ උපසම්පදා සීල ගුණය ඒ මිනුස්සුන්ට නෑ. සාමණේර භික්ෂුන්ටත් ඒ ගුණය නෑ. සතර පරාජිකා ශික්ෂාපද ආරක්ෂා වෙලා තිබෙන තාක් කල් ඒ භික්ෂුන්වහන්සේ සජීවී උපසම්පදා

භික්ෂූන්වහන්සේ නමක්. ඒ හාමුදුරුවන්ට ඒක අයින් කරන්න කියලා කියන්න කිසි කෙනෙකුට අයිතියක් නෑ. ඒක නිසා බුදුරජාණන්වහන්සේ එහෙම කියන්නෙත් නෑ. ඒකට හේතුව තමයි ඒ භික්ෂූන් වහන්සේට වැරදි හදාගැනීමේ possibility එක හොඳටම තිබෙන නිසා. අනිත් එක තමයි ඒ අධිසීල සංඛ්‍යාත උපසම්පදා සීලය ලබා ගන්න බුද්ධාන්තර ගානක පිං තිබෙන්න ඕනෑ. එහෙම අවස්ථාවක පාරාජිකා උනොත් ඇරෙන්න පැවිද්ද නැති වෙනවා කියලා බුදුරජාණන් වහන්සේ කියන්නේ නෑ.

නමුත් සාමණේරයන් වහන්සේලා අයින් කරන්න පුළුවන්. අනිත් කාරණය තමයි සාමණේර බව ලබන්නේ එක හාමුදුරුවෝ කෙනෙකුගෙන්. උපසම්පදාව ලබන්නේ සංඝයාගෙන්.

අපේ පින්වතුන් දැනගෙන තිබෙන්න ඕනෑ මේ ගැන. සාමණේර භාවය ලබන්නේ එක හාමුදුරුවෝ කෙනෙකුගෙන්. අනිත් එක තමයි බලෙන් මහණ කරන්නත් බෑ. ඒ හාමුදුරුවෝ ඇවිල්ලා පා මුල වැටිලා මාව මහණ කරන්න කියලා ඉල්ලා සිටින්න ඕන.

“ඔකාසා අහං භන්තෙ, පබ්බජ්ජං යාචාමි. දුතියම්පි අහං භන්තේ, පබ්බජ්ජං යාචාමි. තතියම්පි අහං භන්තේ, පබ්බජ්ජං යාචාමි.”	“පළමුවත් දෙවෙනුවත් තුන්වෙනුවත් මම පැවිද්ද ඉල්ලා සිටිමි” කියලා ආයාචනා කරන්න ඕන.

ඊට පස්සේ

“සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාන සච්ඡිකරණත්ථාය ඉමං කාසාවං ගහෙත්වා පබ්බාජේථ මං භන්තේ, අනුකම්පං උපාදාය”	“අනුකම්පාව උපදවලා ස්වාමීනි මේ සිවුරු අරගෙන මාව පැවිදි කරන සේක්වා” කියලා අරාධනා කරන්න ඕන.

මේ විදියට ස්වාමීන්වහන්සේට ආරාධනා කළහම තමයි සුදුසු කෙනෙක් නම් පැවිදි කරන්නේ. එතකොට ඒ පැවිද්ද ලැබෙන්නේ උපාධ්‍යායන් වහන්සේගෙන්. මෙලෙස උපාධ්‍යායන් වහන්සේගෙන් පැවිද්ද ලබාගත්තු සාමණේරයන් වහන්සේ හැම වේලාවකම උපාධ්‍යායන් වහන්සේගෙන් අවසර ඇතුව තමයි හැම වැඩේම කරන්න ඕන.

සාමණේර කියන වචනයේ තේරුම් ‘සමණ + ඒර’ කියන එකයි. ‘සමණානං එරො සාමණෙරො’. ‘එර’ කියලා කියන්නේ පුතා කියන එකයි. ශ්‍රමණයන් වහන්සේගේ පුත්‍ර භාවයට පත් උනාවූ කෙනා තමයි සාමණේර කියලා කියන්නේ. සිංහලෙන් කියන්නේ ‘හෙරණ’ කියලා. හෙරණ පාදයන් වහන්සේ කියලා කියනවා. ‘නිග්‍රෝධ හෙරණුන් වහන්සේ’ කියලා කියනවා. ‘සංඝ රාජ හෙරණ පාදයෝ’ කියලා කියනවා. ‘හෙරණ’ කියලා කියන්නේ සාමණේර කියන එකයි. සාමණේර හාමුදුරුවන්ට සංඝ අයිතියක් නෑ. සංඝයාට තිබෙන වරප්‍රසාද, සංඝ සීල මොකුත් නෑ. සාමණේර දස සීලයක් තිබෙනවා. ඒක සාසනික වශයෙන් තිබෙන දස සීලය උනත් හාමුදුරුවෝ කෙනෙකුගෙන් ඉල්ලගෙන රකින්න ඕන. ඒ සිවුරු එහෙම ඔක්කොම අයිති ගුරු හාමුදුරුවන්ට.

අපි හිතමු තමන් කඩෙන් සිවුරක් අරගෙන ගිහිල්ලා ගුරු හාමුදුරුවන්ට දෙනවා මහණ කරන්න කියලා. කඩෙන් ගත්ත කථාවයි ගුරු හාමුදුරුවන්ට දීලා මහණ කරන එකයි දෙකක්. එයා කඩෙන් සිවුරක් ගත්තට එයාට මහණ වෙන්න බෑ. සිවුරයි අඳනෙයි දෙක රුපියල් 5000 ක් කියලා හිතමු. ඒක ගුරු හාමුදුරුවන්ට දුන්නට පස්සේ ඒක අයිති ගුරු හාමුදුරුවන්ට. උපාධ්‍යායන් වහන්සේට සිවුරුයි පිරිකරයි මහණකමයි ඔක්කෝම අයිතියි. යම් කිසි විදියකින් වත් නොගැලපෙන නොහික්මෙන මොකක් හරි වැඩක් කලොත් එහෙම ඒ සාමණේරයන් වහන්සේට දඩුවම් දෙන්න පුළුවන්. වැරදි 5 ක් තිබෙනවා දඩුවම් දෙන්න පුළුවන්. විකාල භෝජනය නිසා දඩුවම් කරන්න පුළුවන්. නැටුම් ගැයුම් වැයුම් ආදී දේවල් වලට දඩුවම් කරන්න පුළුවන්. උස් අසුන් මහා අසුන් පරිහරණය නිසා දඩුවම් කරන්න පුළුවන්. මුදල් පරිහරණය නිසා දඩුවම් කරන්න පුළුවන්. ඒවාට බුදුරජාණන්වහන්සේ දඩුවම් පණවලා තිබෙනවා, මේ වගේ දේකට හික්මවන්න මෙවගේ දෙයක් කරන්න කියලා. කොටු කරන්න

කියලා කියනවා දවසක් දෙකක්. සමහර වැරදි තිබෙනවා දඬුවම් දෙන්නේ නෑ, කෙලින්ම පන්නන්න කියලා තිබෙනවා. සිවුරු ගලවලා නැවත මහණ කරන ක්‍රමයකුත් තිබෙනවා. සමහර වැරදි කරහම මහණ කම නැතිවෙනවා. එයා නැවත හික්මෙන්න කැමති නම් නැවත මහණ කරන්න ඕන. සමහර තිබෙනවා වැරදි, ඒවා කළහම එළවලාම දාන්න කියලා තිබෙන්නේ.

භික්ෂුණී දූෂකයා තියා ගන්න එපා, පන්නන්න කියලා තිබෙනවා. යම් කිසි ගිහියෙක් භික්ෂුණියක් දූෂණය කරලා තිබෙනවා නම් ආවත් මහණකම දෙන්න එපා කියලා තිබෙනවා. යම් කිසි සාමණේර කෙනෙක් භික්ෂුණියක් දූෂණය කළා නම් සාමණේර කම හිටින්නේ නෑ. ඒ අය තියා ගන්න එපා කියලයි කියලා තිබෙන්නේ. මේ වගේ 11 දෙනෙක් ඉන්නවා මහණ කරන්න එපා කියපු. අනිත් එක තමයි 'ථෙය්‍යසංවාසකයෝ' කියන අයව මහණ කරන්න එපා කියනවා. 'ථෙය්‍යසංවාසකයෝ' කියලා කියන්නේ තමන්ම හොරෙන් සිවුරු පොරවාගෙන ඉන්න අය. තව නපුංසක අය මහණ කරන්න එපා කියල කියනවා. පච්ච කොටා ගත්ත අය, රාජ බටයෝ, අංග විකල අය අපස්මාරය වගේ ලෙඩ තිබෙන අයට මහණ වෙන්න බෑ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස පරාජිකා වලට අමතරව තව 13 ක් ගැන මම අහලා තිබෙනවා., සමාව අරගෙන...

<u>පිළිතුර</u> - ඔව් ඒවා healable. ඒවාට සමාවගන්න බෑ, සංඝ කර්ම කරන්න ඕන. කොහොමත් සිල් රකින හාමුදුරුවරු අවංකවම සිල් රකිනවා. මොන වරද උනත් හඟවන්නේ නැතුව සංඝයාට කියලා, probation period එකක් තිබෙනවා ඒවා කරලා හැම වෙලේම සීලය පිරිසිදුව තමයි ඉන්නේ. පොඩි මොකක් හරි තිබුනත් විනය කර්ම කරලා ඉක්මනට පිරිසිදු වෙනවා. බුරුමෙත් තායිලන්තෙත් අරණ්‍ය වල එහෙමයි.

ඇත්ත වශයෙන්ම සමහර හාමුදුරුවරු ඉන්නවා තමන් කරන්නේ මොකක්ද කියලවත් දන්නේ නෑ. ලංකාවෙත් කණගාටුදේ තමයි සමහර හාමුදුරුවරු ඉන්නවා අධ්‍යාපන ආයතනවල මහාචාර්යවරු. ඒ අය මහණ කමේ කරන්න තිබෙන වැඩ දන්නේ නෑ. හරියට බොරු කියනවා. රට හදන්න දන්නවා. ආර්ථිකය දන්නවා. ඒවාට උපදෙස් දෙනවා. මහණ කම ගැන 'මම මේක රකින්න ඕන, ශික්ෂණය මේකයි, මේක බුදුරජාණන්වහන්සේ අපිටයි දේශනා කළේ' කියන ටික දන්නේ නෑ. තමන්ගේ සීලය, තමන්ගේ ගුණය, තමන්ගේ ප්‍රතිපත්තිය දන්නේ නැතුව මොන රටවල් ද හදන්නේ.

තවත් එකක් තමයි, අර හාමුදුරුවෝ කෙනෙක් හිරේ දැම්ම ළඟදී. ප්‍රසිද්ධ අධ්‍යාපන ආයතනයක ගෝල පිරිසක් ඉන්න ප්‍රධාන පාලක හාමුදුරුවෝ කෙනෙක්, විශ්ව විද්‍යාලයක මහාචාර්ය වරයෙක් කියනවා ඔය හිරේ දාපු හාමුදුරුවන්ට සිවුර ගලවලා jumper එක ඇන්දුවොත් එහෙම දවස් හතක් යන්න ඉස්සෙල්ලා ඒ හාමුදුරුවන්ගේ උපසම්පදාව නැති වෙනවා කියලා. ජම්පරයක් ඇඳලා අවුරුදු හතක් හිටියත් මහණ කම නැති වෙන්නේ නෑ. එහෙම මහණ කම නැති කරන්න බෑ. එහෙම නම් මහණ කම තිබෙන්නේ සිවුරේ. මෙච්චර ත්‍රිපිටකයක් තිබෙනවා එක්කෝ බලලා කියන්න එපායැ. ඔවා ලෝකයට යනවා. එක්කෝ හොයලා බලලා කියන්න ඕනෑ.

යම් කිසි විදියකින් කවුරු හරි උපසම්පදා හාමුදුරුවෝ කෙනෙකුට surgery එකක් කරන්න උනා කියලා හිතමු. Surgery එක කරලා ICU එකට දැම්මා කියලා හිතමු. ඒකට දාන්නේ ගවුමක් වගේ එකක් අන්දලා nursing purpose එහෙකට නිසා. එහෙම නම් ඒකෙ සති දෙකක් විතර ඉඳලා එළියට එනකොට ඒ හාමුදුරුවන්ගේ මහණ කම නැති වෙන්න ඕන. ඔවා ධර්ම නොවෙයි. විනයත් නොවෙයි. ඒ අයට හිතෙන හිතෙන ජාති කියනවා. ඒක හරිම කණගාටුදායක දෙයක්. හාමුදුරුවරු ධර්මය දන්නේ නෑ.

මම එක දවසක් ඔස්ට්‍රේලියාවේ ගිහින් බණක් කිව්වා. ප්‍රශ්නත් මිනිස්සු ඇහුවා. ඔක අහගෙන හිටියා නුවර පැත්තේ අධ්‍යාපන අධ්‍යක්ෂක වරයෙක්. ඒ කියන්නේ පළාතක් භාර අධ්‍යක්ෂක හාමුදුරුවෝ කෙනෙක් අහගෙන හිටියා. ඒ හාමුදුරුවෝ ඇවිල්ලා මට කියනවා ලංකාවේ නම් මේ බණ කියලා තේරුම් ගන්වන්න අමාරුයි කියලා. අපිටත් කියන්න බෑ හාමුදුරුවනේ කියලා ප්‍රශංස කළා. ප්‍රශංසාවට වඩා කණගාටු දායක

දේ තමයි පළාතක් භාර අධ්‍යාපන අධ්‍යක්ෂ හාමුදුරුවෝ   මිනිස්සු අහන ප්‍රශ්න දන්නේ නෑ. හේතුව මේ පැති හිතන්නේ නෑ. මේ බුදුරජාණන් වහන්සේගේ ගැඹුරු ධර්මය ගැන හිතන්නේ නෑ. කියවන්නෙත් නෑ. ඒ ගැන අදහසක් නෑ. එවැනි කෙනෙක් යම් කිසි ආයතනයක පාලකයෙක් උනා නම් ඒ අයගෙන් වැඩෙන්නා වූ අය ඔක්කොම අනාථ අසරණ වෙච්ච භික්ෂූන් වහන්සේලා.

හොඳයි එහෙනම් අපි දැන් භාවනා කරමු.

සාධූ! සාධූ! සාධූ!



ඉහත සඳහන් ධර්ම දේශනාව අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.